# වයඹ පලාත් පාලන දෙපාර්තමේන්තුව

## වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂයේ /55 වන සභා වාරයේ මහා සභා රැස්වීම් වාර්තාව -කෙටුම්පතකි

### 2022-09-08

**පැමිණීම**

1. ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතා
2. ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා
3. ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා
4. ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා
5. ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා
6. ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය
7. ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා
8. ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා
9. ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා
10. ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
11. ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා
12. ගරු මන්ත්‍රිනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මිය
13. ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය
14. ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා
15. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා
16. ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා
17. ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා
18. ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා
19. ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා
20. ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා
21. ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා
22. ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා
23. ගරු මන්ත්‍රී එල්. සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
24. ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා
25. ගරු මන්ත්‍රී ඩබ්.සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
26. ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය
27. ගරු මන්ත්‍රිනී පී.එම්.ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය

28. ගරු මන්ත්‍රිනී එම්.එම්.මේරි.වාලට් කුරේ මහත්මිය
29. ගරු මන්ත්‍රිනී ඩබ්.දුලක්ෂි චමෝදරී ප්‍රනාන්දු මහත්මිය
30. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා
31. ගරු මන්ත්‍රිනී ඒ.එම්.චමිලා දිල්රුක්ෂිකා මහත්මිය
32. ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා
33. ගරු මන්ත්‍රී එස්.එම්.සුදත් චන්දන මහතා
34. ගරු මන්ත්‍රී අයි.බී.සෑම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා
35. ගරු මන්ත්‍රී එස්.එම්.දර්ශන දිමුතු කුමාර සුහසිංහ මහතා

මෙදින පෙ.ව.10.00ට මහා සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ විය.

ආගම සිහිකිරීමෙන් අනතුරුව මහා සභා රැස්වීම සඳහා සහභාගී වී සිටින ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්/තුමියන් හා සහභාගී වී සිටින ලේකම්මහතා හා එම නිලධාරීන් ඇතුළු සියළු දෙනාම මහා සභා රැස්වීම සඳහා ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදී.

## 01. 2022-08-05 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.

ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව 06 වන පිටුවේ "කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට වෙන්නප්පුවේ පාසල් සඳහා වෙන්නප්පුව සභාවෙන් ගන්නා ලෙසට දැනුම් දිය හැකි බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී." ලෙස සඳහන් වන බවත්, එය කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂකතුමාට දැනුම්දීමක් නොව ඉල්ලීමක් කරන ලෙසට සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

සංශෝධනය-

06 වන පිටුවේ අවසන් ඡේදයට ඉහළින් ඇති ඡේදය පහත පරිදි සංශෝධනය විය.

"කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට වෙන්නප්පුවේ පාසල් සඳහා වෙන්නප්පුව සභාවෙන් ගන්නා ලෙසට ඉල්ලීමක් කල හැකි බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී."

- ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව තමන් පසුගිය මහා සභා වාරයේ මහා සභාවට සහභාගී නොවූ බැවින් සංශෝධන ඉදිරිපත් කල නොහැකි බවත්, 06 වන පිටුවේ google map එක සම්බන්ධ සාකච්ඡාවේදී වෙන්නප්පුව ශු.පවුලේ බාලිකා විද්‍යාලය ලෙස සඳහන් කර ඇති බවත්, එය වෙන්නප්පුව ශු.පවුලේ ප්‍රාථමික බාලිකා විද්‍යාලය ලෙස සංශෝධනය විය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම මෙම සාකච්ඡාවේදී "නාත්තන්ඩියෙන් ලබා දෙන google map එක තුළ යම් යම් පාසල් ඇතුළත් නොවූ බවත්" ලෙස සඳහන් වන බවත්, මෙය බරපතල ගැටළුවක් බවත් අධ්‍යාපන අමාත්‍යාංශය එවා තිබෙන ළමුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛයට ව්‍යාජව තොරතුරු සැපයීමක් බවත්, එය නාත්තන්ඩිය ප්‍රදේශීය සභාවෙන් සිදු කරන්නේ නම් එය සම්පූර්ණයෙන්ම වැරදි බවත් ඒ සම්බන්ධව අපද ක්‍රියාමාර්ගයක් ගත යුතු බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.එමෙන්ම සභා වාර්තාවේද එය සඳහන් කර තිබේනම් එමෙන්ම මෙමඟින් පාඩුවක් සිදු වී තිබෙනුයේ අප සභාවට බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධව අදාල බලධාරීන්ට අප විසින් දැනුම් දීමක් කර තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එය නොසලකා හැරිය නොහැකි බවත්, ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතාද ළමුන් 600 පමණ වෙන්නප්පුව ශා.ජෝෂප් වාස් විද්‍යාලයට අයදුම්පත් ලබා දෙන බව සඳහන් කරඇති බවත් එතරම් තරඟකාරී පාසල් 2ක google map එක වංචනිකව සිදුවේ නම් එවැනි අඩුපාඩුවක් තිබේනම් එහි විශාල වරදක් තිබෙන බවත් මේ සම්බන්ධව ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මියද අදහස් ප්‍රකාශ කර තිබෙන බවත් පවසා සිටින ලදී.

ගරු මන්ත්‍රී ඒ. එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව පාසල් වලට දරුවන් ඇතුළත් කිරීමේදී ඉතිහාසයේ ඡන්දහිමි නාම ලේඛණය පමණක් ගත් බවත්, යම් කාල සීමාවක සිට මෙම google map එක ගත් බවත්, ඒ කාලසීමාව තුළ යන්ත්‍රය සවි කරගත් අවස්ථාවේ මෙම ප්‍රදේශයේ සියළු පාසල් එයට ඇතුළත් කර ගත්තාදැයි නොදන්නා බවත්, නමුත් අප යන්ත්‍රය තුළ පාසල් 42ම ඇතුලත් කර ගත් බවත් ප්‍රකාශ කරන ලදී.

මෙතැනදී අප සභාවෙන් google map එක ගන්නා ලෙසට අදහස් කල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සභාවක් ලෙස අප එසේ කල යුතු බවත්, තාක්ෂණික ගැටළුවක් මෙහි තිබෙන බවත්, එහිදී රජයේ චක්‍රලේකය අවභාවිතා කිරීමක් සිදු වන බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව මඟින් පළමුවෙන්ම google map එක නිකුත් කිරීම ආරම්භ කල බවත්, මේ වන විට එය දුන්කන්නාවේ තිබෙන බවත්, ජනතාව දුරක් ගෙවාගෙන එය ලබා ගැනීමට එහි යන බවත් ගරු මන්ත්‍රී ඒ. එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

මෙතැනදී නොකියා කියනුයේ නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව ව්‍යාජ වාර්තාවක් ලබාදෙන බවයැයි ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

එසේ නොව එතැනදී පාසල් එම google map එක තුලට ඇතුලත් නොවීමේ දුර්වලකමක් තිබෙන බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

ගැටුමකට පරිවර්තනය වීමට මෙම අදහස් එකතු නොකල බවත්, වෙන්නප්පුවේ පාසල් අපට යොමු කර ගැනීම පිලිබඳව සාකච්ඡා කල බවත්, මෙය කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂකතුමාට යොමු කර ඇති බවත්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකතුමාවද දැනුවත් කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

- ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව 06 වන පිටුවේ පස්වන ඡේදය ශුද්ධවූ පවුලේ ප්‍රාථමික බාලිකා විද්‍යාලය ලෙස සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

  සංශෝධනය-

  "වෙන්නප්පුව ශුද්ධවූ පවුලේ ප්‍රාථමික බාලිකා විද්‍යාලයෙන් එසේ පවසා තිබූ බවත්,නමුත් තමන් දන්නා සියළුම දෙනාට අප රාජ්‍ය ආයතනයක් බැවින් මෙමඟින් එම සේවාව ලබා ගන්නා ලෙස පැවසූ බවත්, ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී."

- පසුගිය කාලයේ වෙන්නප්පුව ශා. ජෝශප් වාස් විද්‍යාලයට ඇතුල් වීමට google map එකක් නොඉල්ලූ බවත් නමුත් දැන් ජාතික පාසලක් බැවින් එය ඉල්ලන බවත් ලෙසද වාර්තාවේ සඳහන් වන බවත්, එය වෙන්නප්පුව ශුද්ධවූ පවුලේ ප්‍රාථමික බාලිකා විද්‍යාලය නොවේදැයි ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

  එය වෙන්නප්පුව ශා.ජෝෂප් වාස් විද්‍යාලය බවත්, ජාතික පාසල් වලට මීන්පෙර google map එක නොඉල්ලූ බවත්, මේ වන විට එය ඉල්ලන බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී. කෙසේ වෙතත් දෙමාපියන් තමන් සිටිනා ස්ථානය ඔප්පු කිරීම සඳහා කැමැත්තෙන්ද මෙය රැගෙන යන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

- පසුගිය මහා සභාව සතියකට පෙර කැඳවූ බවත්, නමුත් කිසිඳු දැනුම්දීමක් සිදු නොකල බවත්, 12 වන සිකුරාදා එය පැවැත්වීමට තිබූ බවත්, නමුත් සතියකට පෙර මහා සභාව පැවැත්වීමට වාර්තාව ගෙනැවිත් දුන් බවත් එහිදී මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් කඩවන බවත්, න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට දින 7කට පෙර යෝජනා ලබා දිය යුතු බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.පෝය 11 වන දින නම් 12 වන සිකුරාදා දින පැවැත්වීමට තිබූ බවත්, නමුත් ඒ සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන් විරෝධතාවය පල කර නොමැති බවත් පෙර දැනුවත් වී තිබුනාදැයි නොදන්නා බවත් මේ සම්බන්ධව තමන් දැඩි විරෝදය එල්ල කරන බවත් ප්‍රකාශ කරන ලදී.

  යම් කාරණාවක් තිබූ බැවින් එය සතියක් ඉදිරියට ගත් බවත්, මෙම අවස්ථාවේදී එම කාරණය තම මතකයේ නොමැති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

  එය ගැටළුවක් නොවන බවත්, නමුත් යෝජනා ලබා දීමට මන්ත්‍රීවරුන්ට කලින් දැනුම් දෙන ලෙසත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

  ඉදිරියේදී එලෙස සිදු නොවන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

- 2022-07-14 වන දින මහා සභාවේදී වෙන්නප්පුව කොට්ඨාසයේ අනවසරයෙන් පුද්ගලික මාර්ගයකට ජලය බැස්වීම සම්බන්ධයෙන් ලිපියක් සභාගත කල බවත්, මාස 02ක් ගත වී ඇති බවත්, එයට ගෙන තිබෙන පියවර පිළිබඳව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී. ගරු සභාපතිතුමා විසින් 2022-05-26 වන දින දවස් 07කින් එය සිදු කරන ලෙසට ලිපියක් මඟින් දැනුම් දී ඇති බවත් තවමත් එය සිදු වී නොමැති බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

  ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා එයට සම්බන්ධ වී ඇති බවත්, එය කිරීමට ගරු මන්ත්‍රීතුමා සම්බන්ධීකරණය වී භාරගෙන ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

  එයට ගරු මන්ත්‍රීතුමා නොව තාක්ෂණ නිලධාරී මහතෙකු සම්බන්ධ විය යුතු බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රීතුමාද සම්බන්ධ විය යුතු බවත්, එතුමා සම්බන්ධ වී එය අවසන් කරාවියැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 01<br><br>2022-08-05 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. |

## 02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

### 01. නිවාඩු අනුමත කිරීම

a) මහා සභාව සඳහා නොපැමිණෙන ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

| |
|---|
| තීරණ අංක 02<br><br>මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දන්වා නිවාඩු අයදුම්කර ඇති පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සඳහා ගරු සභාපතිතුමා ඉදිරිපත් කල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.<br><br>• ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා<br>• ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා<br>• ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා<br>• ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය<br>• ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා<br>• ගරු මන්ත්‍රී වී.ඒ.වර්ණ රංග ගුණසේකර මහතා<br>• ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා |

b) ගරු මන්ත්‍රිනී ආර්.පී.නදීකා රණවීර මහත්මිය විසින් පෞද්ගලික කාරණාවක් සම්බන්ධයෙන් මාස තුනක කාලයක් සඳහා නිවාඩු ලබා දෙන ලෙස ඉදිරිපත් කර ඇති ඉල්ලීම සලකා බලන ලද අතර පහත සඳහන් පරිදි තීරණය කරන ලදී.

| |
|---|
| තීරණ අංක 03<br><br>ගරු මන්ත්‍රිනී ආර්.පී.නදීකා රණවීර මහත්මියගේ ඉල්ලීම පරිදි මාස තුනක කාලයක් සඳහා නිවාඩු ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

c) කාරක සභා සඳහා නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

තීරණ අංක 04

2022අගෝස්තු මස පැවති පහත සඳහන් කාරක සභා සඳහා සහභාගී නොවූ පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

**2022 අගෝස්තු මස 23 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| 4. | ගරු මන්ත්‍රිනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 5. | මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රිනී එච්.එම්.සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය |

**2022 අගෝස්තු මස 05 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 2. | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| 4. | ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා |
| 5. | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා |

**2022 අගෝස්තු මස 19 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්‍රිනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 4. | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| 5. | ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා |
| 7. | ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා |

**2022 ජූලි මස 19 වන දින පැවති ක්‍රීඩා සංවර්ධන හා ප්‍රජා සංවිධාන ශක්තිමත් කිරීමේ කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා |
| 2. | ගරු මන්ත්‍රිනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මිය |
| 3. | ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා |
| 4. | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| 5. | ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා |
| 6. | ගරු මන්ත්‍රිනී ඩබ්.දුලක්ෂි චමෝදරී ප්‍රනාන්දු මහත්මිය |
| 7. | ගරු මන්ත්‍රිනී ඒ.එම්.චමිලා දිල්රුක්ෂිකා මහත්මිය |

**2022 අගෝස්තු මස 19 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කළමනාකරණ කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| **1.** | ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා |
| **2.** | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| **3.** | ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා |
| **4.** | ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා |
| **5.** | ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා |

**2022 අගෝස්තු මස 25 වන දින පැවති පරිසර හා සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභාව**

| නම | නම |
|---|---|
| **1.** | ගරු මන්ත්‍රිනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| **2.** | ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා |
| **3.** | ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා |
| **4.** | ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා |
| **5.** | ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා |

02. හෙට දින විශේෂ ආගමික වැඩ සටහන් දිනයක් සේ සලකා සභාවේ නිලධාරීන් ඇතුළු සේවක මහත්ම මහත්මීන්ටද, සියළුම ගරු මන්ත්‍රීවරුන්ටද එයට සමගාමීව දිව්‍ය පූජාව සහ වරු පිරිත ද සූදානම් කර තිබෙන බවත් එයට සියළුම දෙනාටම ගෞරවයෙන් ආරාධනා කරන ලදී. එමෙන්ම අප ආසනය තුළත්, පුත්තලම් දිස්ත්‍රික්කය තුළත් ක්‍රියාකාරිව අඛණ්ඩව වසර 25ක් පාර්ලිමේන්තුව නියෝජනය කල හිටපු ගරු අමාත්‍ය මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමාගේ 78 වන ජන්ම දිනය එදිනට යෙදී තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. එතුමාගේ ආභාෂය සමග දේශපාලනයට පැමිණි මන්ත්‍රීවරුන් විශාල ප්‍රමාණයක් සිටින බවත් එබැවින් එතුමාව ගෙනැවිත් උපහාරයක්ද පැවැත්වීමටත් එතුමාවද මෙම ආගමික වැඩ සටහන් සඳහා සහභාගී කරවා ගැනීමට තීරණය කල බවත්, දිව්‍ය පූජාව උදෑසන 09.00ටද වරු පිරිත සවස 03.00ටද දිව්‍ය පූජාවෙන් පසුව එතුමාගේ උපහාර උත්සවයද පැවැත්වීමට කටයුතු සූදානම් කරඇති බවත් ප්‍රකාශ කරන ලදී. මින් පෙරද එවැනි උපහාර උත්සව පැවැත්වීමට තමන්ට හැකි වූ බවත්, ගරු පෙස්ටස් පෙරේරා මැතිතුමාටද ඇල්බට් ඇෆ් පිරිස් ක්‍රීඩාංගනයේ වෙන්පුර අරුණළු ක්‍රීඩා සැණකෙලියට සමගාමීව එතුමාගේ නිවසට ගොස් එතුමා විසින් සිදු කල මෙහෙවර වෙනුවෙන් උපහාරය පිදූ බවත්, එමෙන්ම ගරු සිඩ්නි ජේ ප්‍රනාන්දු මැතිතුමාටද වෙන්නප්පුව පුස්තකාලය වෙනුවෙන් සිදු කර මෙහෙවරට උපහාරය ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී.

මෙම දිව්‍ය පූජාව පැවැත්වෙන ස්ථානය පිළිබඳව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසීමක් සිදු කරන ලදී.

එය මෙම සභා පරිශ්‍රයේ පැවැත්වෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා අප සභාවේ අරමුදල් භාවිතා කරන්නේ දැයි ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

ආගමික වැඩසටහන් සුභ සාධක සංගමය මඟින් සූදානම් කර තිබෙන බවත්, ජ්‍යේෂ්ඨ පුරවැසි ඇගයීම සම්බන්ධයෙන් සභාවෙන් යම් මුදලක් දැරීමට හැකියාව තිබෙන බවත්, උපහාරය පිදීමේ සංකේතයට එම අරමුදල භාවිතා කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එම අරමුදලින් උපහාරය දැක්විය හැක්කේ කාට දැයි ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

- ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව සෑම වර්ෂයකම අයවැය ලේඛණය තුළ ඡේෂ්ඨ පුරවැසියන් ඇගයීම සඳහා රු.50,000.00ක පමණ මුදලක් වෙන් කරන බවත්, මෙම බල ප්‍රදේශය තුළ සමාජ ක්‍රියාකාරිකයෙකු, දේශපාලඥයෙකු, ක්‍රීඩකයෙකු ආදී ඇගයීමකට උපහාරයකට ලක් විය යුතු ඕනෑම ඡේෂ්ඨ පුද්ගලයෙකුට එය ලබා දිය හැකි බවත්, මෙම වසරේ මෙතුමාව යෝජනා වූ බවත් ඕනෑම ක්ෂේත්‍රයක කෙනෙකුට එම උපහාරය ලබා දිය හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

03. අඩු ආදායම්ලාභී පවුල් සඳහා වැසිකිළි ආධාර ලබා දීම මෙම මස අවසන් කිරීමට සැලසුම් කර ඇති බැවින් අදාල අයදුම්පත්‍ර මෙම මස 15 වන දිනට පෙර විෂය භාර නිලධාරී වෙත ලබා දෙන ලෙස කාරුණිකව දැනුම් දෙන ලදී.

විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට එය ලබානොදෙන්නේදැයි ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

මෙම මුදල් කොට්ඨාස මට්ටමින් වෙන් වන බවත්, කොට්ඨාසයේ මන්ත්‍රීවරයා කැමති නම් එය ලබා දිය හැකි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

04. දංකොටුව උප කාර්යාල බල ප්‍රදේශයේ ටී.ඒ.ප්‍රගීත් අසංක ජයසිංහ යන අය විසින් පහළ දුම්මලකොටුව ග්‍රාම සේවා වසමේ " දුම්මල කොටුව වත්ත" නමැති ඉඩම කට්ටි කිරීමේදී සභාවට ලබා දිය යුතු 10%ක භූමි ප්‍රමාණය පර්චස් 42.08ක් වුවද ඔහු විසින් භූමියෙන් ලබා දී ඇත්තේ පර්චස් 34.8ක භූමි ප්‍රමාණයකි. ඒ අනුව සභාව වෙත ලබා දිය යුතු ඉතිරි භූමි ප්‍රමාණය වන පර්චස් 7.28 සඳහා පලාත් පාලන කොමසාරිස්තුමාගේ 2022-07-11 දිනැති ව/පාපාදෙ/03/13/09/21 (පොදු පුත්) අංක දරණ ලිපියේ උපදෙස් පරිදි තක්සේරු කමිටුව විසින් නිර්දේශ කරන ලද රු.1,135,680.00 මුදලක් අය කර ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් නිවේදන යටතේ යෝජනා කරන ලදී.

මේ පිළිබඳව විවිධ අදහස් දක්වමින් දීර්ඝ ලෙස සාකච්ඡා කල සභාව පහත සඳහන් තීරණය ගන්නා ලදී.

| |
|---|
| තීරණ අංක 05<br><br>දුම්මලකොටුව වත්ත නමැති ඉඩම කට්ටි කිරීමේදී සභාවට ලැබිය යුතු 10% බිම් කොටස් පිළිබඳව පලාත් පාලන කොමසාරිස්තුමාගේ ව/පාපාදෙ/03/13/09/21 (පොදු පුත්) අංක හා2022-07-11 දිනැති ලිපිය මඟින් ලබා දී ඇති උපදෙස් අනුව තීරණයක් ගැනීම සඳහා එය ඉදිරි මහා සභා රැස්වීමේ යෝජනාවක් ලෙස ඉදිරිපත් කිරීමටත් ඒ අනුව තීරණයක් ගැනීමත් සුදුසු බවට ගරු මහා සභාව විසින් තීරණය කරන ලදී. |

05. වයික්කාල ශා.බෙනඩික් දේවස්ථානයේ සියවස් ජුබිලි මහෝත්සවයට ලබා දුන් සහයෝගයට මීසම් පාලක පියතුමන් විසින් ස්තුති ලිපියක් ලබා දී ඇති බවත් ඒ සඳහා දායකත්වය ලබා දීමට වෙන්නප්පුව ප්‍රාදේශීය සබාවට හැකි වූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

06. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට අයත් දංකොටුව ජයකොඩි ක්‍රීඩාංගණයේ ඉදි කිරීමට යෝජිත " දිවංගත ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු අනුස්මරණ ගෘහස්ථ ක්‍රීඩාංගනය" සඳහා මුල් ගල තැබීමේ උත්සවය 2022-08-16 වන දින පැවැත්වීමට හැකි වූ බවත් මේ සඳහා සහයෝගය ලබා දුන් ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම් මහතා ඇතුළු කාර්ය මණ්ලඩයට සහ දංකොටුව ක්‍රීඩා සංවර්ධන පදනම ඇතුළු සියළුම දෙනාටම ස්තුතිය පුද කරන ලදී.

07. 2022-08-26 වන දින වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය සේවකයින් සඳහා සෞඛ්‍ය සායනයක් පැවැත්වීමට හැකි වූ බවත් මෙම කටයුතු සංවිධානය කල ජල හා සනීපාරක්ෂක නිලධාරී ඇතුළු මේ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

08. 2022අගෝස්තු මස පහත සඳහන් මාර්ග වල වලවල් ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීමට හැකි විය. ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

- මැටිකොටුව වීදී පාරවල් වලවල් ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීම
- කහටවිල රෝයල් පාක් හි වලවල් ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීම
- වයික්කාල කරුණාකරලා හෝටල් පාර වලවල් ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීම
- වයික්කාල වීදී පාරවල් වලවල් ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීම
- දංකොටුව කොමර්ෂල් බැංකුව ඉදිරිපිට වලවල් ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීම
- දංකොටුව පාරවල් ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීම

සාලියන්කුලම වේලන්කන්නි දේවස්ථාන පාර කොටසක් පමණක් ප්‍රිමික්ස් කර ඇති බවත් ඉතිරියද සිදු කර දෙන ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව ප්‍රාදේශීය සභාවේ ප්‍රතිපාදන ප්‍රාදේශීය සභා පාරවල් වලට වෙන් වන බවත්, තම කොට්ඨාසයේ ගැටළුවක් තිබෙන බවත්, මාර්ග සංවර්ධන අධිකාරියට අයත් පාරක් හරහා කාණුවක් දැමීමට අවශ්‍ය බවත් තාක්ෂණ නිලධාරී ගෙනැවිත් ඇස්තමේන්තු කිරීමට යාමේදී මෙයට අනුමැතියක් ගත යුතු බව පැවසූ බවත් එබැවින් වෙනත් කාණුවක් ඉදි කල බවත් ප්‍රකාශ කල අතර දංකොටුව කොමර්ෂල් බැංකුව ඉදිරිපිට ප්‍රිමික්ස් කර තිබෙන බවත්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන් වූ ආකාරය විමසා සිටින ලදී.

එතැන වලක් තිබූ බවත්, එහි ත්‍රීවිල් පාක් එකද තිබෙන බවත්,ලිපියක් ගෙන මාර්ග සංවර්ධන අධිකාරියේ අවසරයද ඇතිව එය සිදු කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තමාගේ කොට්ඨාසයේද එවැනි ස්ථාන තිබෙන බව ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය ප්‍රකාශ කරන ලදී.

09. ඇටියාවල ශ්‍රී සුමනාරාම විහාරස්ථානයෙහි විහාරාධිපති ස්වාමීන් වහන්සේ ලෙස වැඩ විසූ ගරු පූජ්‍ය ගිරාඳුරුකෝට්ටේ ධම්මසිරි නායක ස්වාමීන් වහන්සේගේ ආදාහන කටයුතු සහ දානමය කටයුතු සඳහා ලබා දුන් දායකත්වයට දායක සබාව විසින් ස්තුති ලිපියක් එවා ඇති බවත් එම වැඩ කටයුත්තට දායක වීමට අපට හැකි වූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

10. ලුණුවිල ප්‍රදීපා ක්‍රීඩාංගණයේ ඇවිදින මංතීරුව පසුගිය දින ජනතා අයිතියට පත් කිරීමට හැකි වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය ඇතුළු සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

11. වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෝලාන ග්‍රාම නිලධාරී වසමේ පිහිටා ඇති නුරාණි කර්මාන්ත පුර ඉඩමේ පිහිටි ආර්.පී.ඉන්ඩස්ට්‍රීස් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම විසින් රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ස්ථාපිත කිරීමට අදාලව අනුමැතිය ලබාදීම සඳහා සභාවේ එකඟතාවය ලබා ගැනීම සඳහා වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාවට යොමු කරන ලදී.

මෙය පරිසර කමිටුව වෙත යොමු කරන ලෙසට පරිසර කමිටුවේ සභාපති ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

එය පරිසර කමිටුව වෙත යොමු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 03.යථා පරිදි කල් දී ඇති යෝජනා

### a. ගරු සභාපතිතුමාගේ යෝජනා

i. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ අලුතින් ප්‍රකාශිත දියුණුකල ගම් ප්‍රදේශයට අදාලව වරිපනම් ඒකක යාවත්කාලීන කිරීමේ කටයුතු මේ වන විට කෙරීගෙන යන අතර පලමු අදියර යටතේ වෙන්නප්පුව උප බල ප්‍රදේශය තුළ එම කාර්යය අවසන් කර 2022.12.31 වන විට ප්‍රකාශයට පත් කිරීමටද, දෙවන අදියර යටතේ සෙසු බල ප්‍රදේශ වල එම කාර්යය 2023 වර්ෂය තුල අවසන් කර ප්‍රකාශයට පත් කිරීමට ද සැලසුම් කර ඇති බැවින් එලෙස යාවත්කාලීන කරන ලද ඒකක අළුතෙන් තක්සේරු කිරීමට හා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය යටතේ එකී යාවත්කාලීන කරන ලද ඒකක හා නව වටිනාකම් ප්‍රකාශයට පත් කිරීමටද, එම තක්සේරු කාර්යය වෙනුවෙන් තක්සේරු දෙපාර්තමේන්තුවේ පිළිගත් විධි විධාන පරිදි ඔවුන්ගේ කාර්යය මණ්ඩලයේ ගමන් වියදම්, සංයුක්ත දිමනා සහ ආහාර පහසුකම් ආවරණය කර ගැනීම වෙනුවෙන් ඒකකයට රු.60.00ක ගාස්තුවක් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ගෙවීමද සුදුසු බවට ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

වෙන්නප්පුව,කොළින්ජාඩිය ප්‍රදේශයේ අද වන විට ඒකක 11,000 පමණක් හඳුනාගෙන තිබෙන බවත්, එය ගැසට් කර ජනවාරි මස සිට වරිපනම් අය කරන බවත් එහිදී 5% ගෙවූ බදු මුදල 4% කර දීමට සූදානම් බවත් මෙහිදී ආදායම දෙගුණයක් වැඩි වන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 06<br><br>වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ අලුතින් ප්‍රකාශිත දියුණුකල ගම් ප්‍රදේශයට අදාලව වරිපනම් ඒකක යාවත්කාලීන කිරීමේ කටයුතු මේ වන විට කෙරීගෙන යන අතර පලමු අදියර යටතේ වෙන්නප්පුව උප බල ප්‍රදේශය තුළ එම කාර්යය අවසන් කර 2022.12.31 වන විට ප්‍රකාශයට පත් කිරීමටද, දෙවන අදියර යටතේ සෙසු බල ප්‍රදේශ වල එම කාර්යය 2023 වර්ෂය තුල අවසන් කර ප්‍රකාශයට පත් කිරීමට ද සැලසුම් කර ඇති බැවින් එලෙස යාවත්කාලීන කරන ලද ඒකක අළුතෙන් තක්සේරු කිරීමට හා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය යටතේ එකී යාවත්කාලීන කරන ලද ඒකක හා නව වටිනාකම් ප්‍රකාශයට පත් කිරීමටද, එම තක්සේරු කාර්යය වෙනුවෙන් තක්සේරු දෙපාර්තමේන්තුවේ පිළිගත් විධි විධාන පරිදි ඔවුන්ගේ කාර්යය මණ්ඩලයේ ගමන් වියදම්, සංයුක්ත දිමනා සහ ආහාර පහසුකම් ආවරණය කර ගැනීම වෙනුවෙන් ඒකකයට රු.60.00ක ගාස්තුවක් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ගෙවීමද සුදුසු බව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

ii. කිරිමැටියාන උප කාර්යාලයට අයත් බල ප්‍රදේශයේ හඳුනාගත් ප්‍රදේශ නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

මෙම නම් කර තිබෙන ග්‍රාම නිලධාරී වසම් ගත් විට සන්තානාපුර මුළු ජනපදයම නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයට අයත් වන බවත් මේ සඳහා සීමා නිර්ණය කර ගන්නා ලෙසත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහි මුළු වසමම ඇතුළත් නොවන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එය ලුණුවිල බෞද්ධ පාසලට එහායින් බව පැවසූ බව මෙහිදී ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

එසේ නම් බුළුගහපාරින් ගොස් බෝතලේගමට යන තෙක් යා යුතු බවත්,පාරෙන් එක් පසෙක ගමද, ජනපදය අනෙක් පසින්ද තිබෙන බවත්, කොට්ටාමුල්ලට යන තෙක් හසු වුවහොත් බදු ගෙවීමට සිදු වන බවත්, මෙයට ගම සහ ප්‍රධාන මාර්ගයේ යම් සීමාවක් හසු විය යුතු බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධව වැඩ අධිකාරි සමඟද සාකච්ඡා කල බවත් මන්ත්‍රීවරුන් කීපදෙනාව කැඳවා සාකච්ඡා කර සීමාව තීරණය කරන ලෙසත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

මෙම යෝජනාව අනුමත කර දෙන ලෙසත්,ඉන්පසුව සීමාව කමිටුවක් මඟින් තීරණය කරමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ලේකම් මහතා මෙහිදී ‘‘ප්‍රධාන මාර්ගය දෙපස‘‘ ලෙස ගරු සභාපතිතුමාට ලිපියේ සටහනක් මඟින් සඳහන් කර තිබෙන බවත්, එසේ නම් කිසිඳු ගමක් ඇතුළට යාමට අවසර හිමි නොවන බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී. සිතියමෙහි එය තිබෙන බවත්, එමෙන්ම මැ/ලුණුවිල ලෙස කියූ විට බුළුගහ පාරින් යන එම සීමාව තවමත් බදු අය කරන තැනට සුදුසුකම් මදි වීමට හැකි බවත් ප්‍රධාන මාර්ගයේ සිට යන සීමාව කමිටුවක් මඟින් කතා කොට තීරණය කරමුයැයිද ප්‍රකාශ කරන ලදී.

මෙහිදී ජනතාවද සභාවද අපහසුතාවයට පත් වන බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මින්පෙරදී හලාවත-කොළඹ ප්‍රධාන මාර්ගයේ මීටර් 100 දෙපසට ලෙස තීන්දු කල බවත්, මේ පිළිබඳව සාකච්ඡා කොට තීරණය කරමුයැයි ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

සතියක් ඇතුළත ගරු මන්ත්‍රීවරුන් එකතු වී සාකච්ඡා කොට තීරණයක් කරන ලෙස ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එම කටයුත්ත සඳහා ලේකම්මහතාව සහ වැඩ අධිකාරීවද ඒ සඳහා යොමු කරන ලෙස ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

එතෙක් ඉදිරි කටයුතු කිරීමට අවසරය ලබාදෙන ලෙසත් කමිටුව මඟින් සීමා තීරණය කරන ලෙසත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

පාරවල් ගැසට් කිරීම සම්බන්ධව ලැබුණ බවත්, එය පිළිවෙලක් නොමැති බවත් තම නිවසට යන පාරද සභාවට අයිති පාරක් ලෙස එහි සඳහන් වී ඇති බවත් ඒවා නිවැරදි කරන ලෙසට ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

එවැනි සංශෝධන තිබේනම් 10 වන දිනට පෙර ලිඛිතව භාරදෙන ලෙස ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම ඉදිරිපත් කර ඇති යෝජනාවට පන්නල පාර ඇතුළත් වී නොමැති බවත්, සිංගක්කුලියට යන තෙක් ප්‍රධාන පාර සම්බන්ධ වී නොමැති බවත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

දංකොටුව උප කාර්යාලයට අයත් කොටස ඇතුළත් කර නොමැති බවත්, ඊළඟට කිරීමට තිබෙනුයේ එය බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

බෝතලේගම සිට පන්සල් හංදිය වන තෙක් කුඹුරු යාය තිබෙන බවත් වරිපනම් සීමාව ඇතුලත් කිරීමේදී ඒවා පිළිබඳව අවධානය යොමු කරන ලෙසත්, මැ/කිරිමැටියාන සිට තුලාවලට යනතෙක් ජනතාවගේ බදු එකතු කරන්නේද යන්න තීරණය කරන ලෙසත් ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 07<br><br>කිරිමැටියාන උප කාර්යාලයට අයත් බල ප්‍රදේශයේ හඳුනාගත් ප්‍රදේශ නාගරික සංවර්ධන අධිකාරී |

බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව පිළිබඳව සාකච්ඡා කල මහා සභාව ගරු මන්ත්‍රීවරුන්ගේද අදීක්ෂණය යටතේ සීමා සලකුණු කිරීමෙන් පසු නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

iii. 2023 වර්ෂයේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් වල පාසල් දරුවන් සඳහා පාසල් අභ්‍යාස පොත් ප්‍රදානයට අදාලව ගරු වයඹ පලාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

- කොට්ඨාස 25 සඳහා අපේක්ෂිත ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය රු.5,000,000.00

අභ්‍යාස පොත් වල මිල වැඩි වී තිබෙන බවත්, අවම වශයෙන් ලක්ෂ 03ක් වත් වෙන් කරන ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ඉල්ලා සිටින ලදී.

අඩුආදායම්ලාභී දුප්පත්ම දරුවන් තෝරාගෙන එය ලබාදෙන ලෙසට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

රජයේ සේවකයෝද සියළු දෙනා අඩු ආදායම්ලාභීන් බව ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

2022 අයවැය තුළ ක්‍රියා කිරීමට යෝජිත අදාල ඉසව් පසුගිය දිනවල ගරු ජනාධිපතිතුමා එවූ චක්‍රලේක අනුව යම් යම් කොන්දේසි තිබීමට හැකි බවත්, නමුත් සභාවේ අනුමැතිය තුළ එකඟතාවයට ගරු ආණ්ඩුකාරතුමා වෙත එය අනුමැතියට යොමු කරන ලෙස ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

අයවැය සෑදීමේදී කෝටි 40 අයවැය සෑදීමට ගියද කෝටි 45 පමණ වැය වන බවත් අද වන විට වරිපනම් ඒකකද ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා සමඟ එකතු වී සකස් කර නොතිබුණේ නම් මන්ත්‍රීවරුන්ට කිසිදු මුදලක් දීමට සිදු නොවන බවත්, ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. සැලසුමක් සකස් කර ඒ අනුව මහන්සි වී වැඩ කල බවත්, නිලධාරීන් ද මහන්සි වී වැඩ කටයුතු කල බවත් අනාගතයට ස්ථිර මුදල් ආරක්ෂා කර බය නැතුව අද දින කතා කිරීමට හැකි වී තිබෙන බවත්, මන්ත්‍රීවරුන්ද උපරිම දායකත්වය ලබා දිය යුතු බවත් ලක්ෂ 50 ඇතුලත ක්‍රියාදාමය සිදු කිරීමට වෙන බවත්, මුදල් වැඩි කිරීමට හැකියාවක් නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 08

2023 වර්ෂයේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් වල පාසල් දරුවන් සඳහා පාසල් අභ්‍යාස පොත් ප්‍රදානයට අදාලව ගරු වයඹ පලාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

- කොට්ඨාස 25 සඳහා අපේක්ෂිත ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය රු.5,000,000.00

iv. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට මිල දී ගැනීමට යෝජිත නැ/නයිනමඩම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ක්‍රීඩා පිටියේ ඉඩම පිළිබඳ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබා ගැනීම සඳහා එහි ඇති සන කැලෑව හා එහි දමා ඇති අපද්‍රව්‍යය ඉවත් කිරීම සඳහා සභාවේ බැකෝ යන්ත්‍රය යොදා සිදු කල නොහැකි බැවින් D-40 වර්ගයේ ඩෝසර් යන්ත්‍රයක් කුලී පදනම මත පැය 25ක සේවා කාලයක් සඳහා ලබා ගැනීම සුදුසු බවට අදාල යෝජනාව ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

ලබන වසරේදී මෝරුක්කුලිය ඉඩමට ලක්ෂ 65 වෙන් කර ඇති බවත්, ඉඩම් රසක් මිල දී ගෙන සභාවට එකතු කර දුන් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.වෙන්නප්පුව නගරය මංතීරු 4 යටතේ

සංවර්ධනය වී කාණු ඉදි වන බවත් අප ප්‍රදේශයේ වාසනාවට මංතීරු 4 ඉදි වීම අපට ලැබුණ බවත් ප්‍රකාශ කරන ලදී. 2018 පත් වූ සභාව සෑම සංවර්ධන ක්‍රියාදාමයකටම හවුල් වූ බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී යූ.ජූඩ් එමානුවෙල් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව දූම්මලදෙණිය පන්සල් හංදියේ ඉඩම පිළිබඳව දීර්ඝ කාලයක සිට කතා කල බවත්, ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් තැන්පත් කරන ලෙස එම විෂයභාර නිලධාරී මහතා පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.

එය අයවැයට ඇතුළත් කර ගැනීමට සිදු වන බවත්, ඉඩම හඳනාගෙන තිබෙනවාද නොදන්නා බවත් අවශ්‍ය ලිපි නොපැමිණි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාට නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍ය ධූරය ලැබුණු බව අද‍දින දැන ගැනීමට ලැබුණ බවත්,ඒ කාරණයද හේතු කර වෙන්නප්පුව ප්‍රදේශයේ අඩුපාඩු තිබෙන බැවින් එම නාගරික සංවර්ධන අධිකාරිය හරහා අරුන්දික මහතාගේ මැදිහත්කමද ගෙන එතුමා දංකොටුව නගරය සංවර්ධනය කලා මෙන්ම හොඳ සංවර්ධන තත්ත්වයකට ගෙන එන ලෙසටද ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ඉල්ලා සිටින ලදී.

එතුමා නාගරික සංවර්ධන අධිකාරියේ අමාත්‍ය ධූරය ලැබුණු විගස තමන්ට මතක් වූයේ දංකොටුව නගර ශාලාව බවත්, අද වන විට එහි වැඩ නිම කිරීම සඳහා කෝටි 20ක් පමණ එයට වැය වන බවත්, එතුමාගේ සහයෝගය ගෙන කෝටි 10ක් හෝ ලබා දුනහොත් වටිනා බවත් එය එතුමාගේ වගකීමද බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේදී කොට්ඨාසයභාර ගරු මන්ත්‍රී ඩබ්.ඒ. රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා ක්‍රීඩා පිටිය පිළිබඳව සොයා බලා වැඩ කටයුතු සිදු කරන බවත් එතුමාට ස්තූතිවන්ත වන බවත්,එම ඉඩම ගැනීමට අයවැයෙහි මුදල් වෙන්කර තිබෙන බවත් ලක්ෂ 40ක්ද ගෙවා ඇති බවත් ගරු සභාපතිතුමා තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 09<br><br>වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට මිල දී ගැනීමට යෝජිත නැ/නයිනමඩම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ක්‍රීඩා පිටියේ ඉඩම පිළිබඳ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබා ගැනීම සඳහා එහි ඇති සන කැලෑව හා එහි දමා ඇති අපද්‍රව්‍යය ඉවත් කිරීම සඳහා සභාවේ බැකෝ යන්ත්‍රය යොදා සිදු කල නොහැකි බැවින් D-40 වර්ගයේ ඩෝසර් යන්ත්‍රයක් කුලී පදනම මත පැය 25ක සේවා කාලයක් සඳහා ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

v. රාජ්‍ය වියදම් පාලනයට අදාල භාණ්ඩාගාර ලේකම්වරයාගේ චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම අනිවාර්යය බවට ජනාධිපති මාධ්‍ය අංශය විසින් එවා ඇති ලිපිය සලකා බලා තීරණයක් ගැනීම සුදුසු බවට අදාල යෝජනාව ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

මෙය සියළුම දෙනාට යොමු කල බවත්, සභාවක් ලෙස තමන් මෙය යෝජනා කරන බවත්, ජනතාවගෙන් එකතු වන මුදල සංවර්ධන ක්‍රියාදාමයට යොමු කිරීමට අවසර ලබාදෙන ලෙසත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 10<br><br>රාජ්‍ය වියදම් පාලනයට අදාල භාණ්ඩාගාර ලේකම්වරයාගේ චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම අනිවාර්යය බවට ජනාධිපති මාධ්‍ය අංශය විසින් එවා ඇති ලිපිය හා එම චක්‍රලේඛය පාදක කරගනිමින් වයඹ පලාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් නිකුත් කර ඇති උපදෙස් ලිපිය පිළිබඳ සලකා බැලූ මහා සභාව විසින් එම උපදෙස් පිළිපැදීමටත් අයවැය ලේඛණය මඟින් සංවර්ධන කටයුතු සඳහා වෙන් කරන ලද |

ප්‍රතිපාදන සහා බල ප්‍රදේශයේ ජනතාවගේ බදු මුදල් අය කර ගැනීමෙන් ලබා ගන්නා ස්වයං උත්පාදන අරමුදල් බවත් එම බදු මුදලින් බල ප්‍රදේශයේ ජනතාවට සේවයක් කල යුතු බවත්, ඉහත උපදෙස් ලිපියේ උපදෙස් අනුව අළුත්වැඩියා හා නඩත්තු කටයුතු පමණක් සිදු කිරීමට කටයුතු කල යුතු බව දන්වා ඇති බැවින් දැනට ප්‍රාග්ධන යටතේ වෙන් කර ඇති ප්‍රතිපාදන අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා පුනරාවර්ථන වැය ශිර්ෂ වෙත මාරු කිරීම සඳහා පලාත් පාලන කොමසාරිස්තුමා මහින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බව තීරණය කරන ලදී. ඒ සඳහා ගරු මහා සභාවේ පූර්ණ එකඟතාවය ද ලබා දෙන ලදී.

vi. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට අයත් දේපල වාර්ෂිකව බදු ලබා දීමේදී සම්ප්‍රදායිකව එකම බදුකරු අඛණ්ඩව දේපල බදු ලබා ගන්නා බැවින්ද සභාවේ බදු දේපල (මස්කඩ,ඉඩම්) වර්ෂ 3ක කාලයක් සඳහා ගිවිසුම්ගතව බදු ලබා දීමෙන් බදුකරුට මෙන්ම සභාවටද වාසිදායක වන බැවින් 2023 වර්ෂයේ සිට මස්කඩ හා ඉඩම් වර්ෂ 03කට බදු ලබා දීම සුදුසු බවට අදාල යෝජනාව ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

වගා කිරීම සඳහා සැම දෙනාම ඉඩම් බදු ලබා ගන්නා බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 11

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට අයත් දේපල වාර්ෂිකව බදු ලබා දීමේදී සම්ප්‍රදායිකව එකම බදුකරුවන් අඛණ්ඩව දේපල බදු ලබා ගන්නා බැවින්ද සභාවේ බදු දේපල (මස්කඩ,ඉඩම්) වර්ෂ 3ක කාලයක් සඳහා ගිවිසුම්ගතව බදු ලබා දීමෙන් බදුකරුට මෙන්ම සභාවටද වාසිදායක වන බැවින් 2023 වර්ෂයේ සිට මස්කඩ හා ඉඩම් වර්ෂ 03කට බදු ලබා දීම සුදුසු බවත් ඒ සඳහා පලාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

කම්මල ගිං ඔය ආශ්‍රිත ඉඩමේ තවමත් මැනුම් කර නොමැති බවත්, පර්චස් 90 භූමියක් තිබුණ බවත්,අසල්වාසින් අල්ලාගෙන තිබෙන බවත්, ගහට මායිම්ව තිබෙන බවත් විශාල වෙළඳ වටිනාකමක් තිබෙන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ලිං ඉදි කිරීම සඳහා සභාවට ලබා දී ඇති ඉඩම් , ඒවාට මායිම්ව සිටින අය අත්පත් කර ගන්නා බවත්, ලිඳ භාවිතා කරන තෙක් පමණක් අපට අයිති බව පණතේ තිබෙන බවත්, පාරවල් වල දූවිලිවලට ගැසීමට හෝ එම ලිං වල ජලය ගන්නා ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මාර්ග සියල්ලම දැන් සිතියම් ගත කර ගැසට් කර තිබෙන බවත්, එලෙසම වැසි ජලය බැස යන පොදු කාණු පද්ධති සභාවේ ප්‍රතිපාදන වැය කර මිනුම් කර වෙන් කරන ලෙසත් තමන්ද වැසි කාලයේදී විශාල ලෙස පීඩාවකට පත් වන බවත් අයවැයට එය එක් කර වෙන් කරන ලෙසත් සිතියම් ගත කර තබන ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා යෝජනා කරන ලදී.

තීරණ අංක 12

වැසි ජලය බැස යන පොදු කාණු පද්ධතිය සභාවේ ප්‍රතිපාදන වැය කර මිනුම් කර ගැසට් කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

viii. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට අයත් ශ්‍රීමත් ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණයේ ගාස්තු සංශෝධනය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කරන ලදී.

තීරණ අංක 13

රටේ පවතින වත්මන් මිල වැඩිවීම් සමඟ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට අයත් ශ්‍රීමත් ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණයේ ගාස්තු 2023 වර්ෂය සඳහා සංශෝධනය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

**ශ්‍රීමත් ඇල්බට් පීරිස් එළිමහන් ක්‍රීඩාංගනයේ ගාස්තු අය කිරීම**

| විස්තරය | කාලය | පාසල් | | ක්‍රීඩා සමාජ | |
|---|---|---|---|---|---|
| | | බල ප්‍රදේශය | පිටත | බල ප්‍රදේශය | පිටත |
| ක්‍රිකට් | දිනකට | 6,000.00 | 7,500.00 | 8,000.00 | 17,000.00 |
| මළල ක්‍රීඩා | දිනකට | 15,000.00 | 20,000.00 | 17,000.00 | 25,000.00 |
| | අමතර දිනකට | 10,000.00 | 15,000.00 | 12,000.00 | 20,000.00 |
| නෙට් බෝල් | එක් තරගයක් සඳහා | 3,000.00 | 4,000.00 | 6,000.00 | 7,000.00 |
| එල්ලේ | දිනකට | 8,000.00 | 12,000.00 | 15,000.00 | 25,000.00 |
| පාපන්දු / හොකී | තරගයක් සඳහා (එක් ක්‍රීඩා පිටියක් සඳහා) | 8,000.00 | 12,000.00 | 10,000.00 | 15,000.00 |
| ක්‍රීඩා පුහුණු කඳවුරු | දිනකට | 5,000.00 | 6,000.00 | 7,000.00 | 8,000.00 |
| සුහද හමුවීමේ උත්සවය | දිනකට | 20,000.00 | 25,000.00 | 30,000.00 | 35,000.00 |

**ශ්‍රීමත් ඇල්බට් පීරිස් ගෘහස්ත ක්‍රීඩාංගනයේ ගාස්තු අය කිරීම**

**පුහුණු තරඟ සඳහා**

| විස්තරය | කාලය | පාසල් | | ක්‍රීඩා සමාජ | |
|---|---|---|---|---|---|
| | | බල ප්‍රදේශයේ | පිටත | බල ප්‍රදේශයේ | පිටත |
| අත්පන්දු/වොලිබෝල් | පැය 01 | 1,000.00 | 1,250.00 | 1,000.00 | 1,500.00 |
| බැට්මින්ටන් | පැය 01 | 250.00 | 350.00 | 450.00 | 450.00 |
| පැසි පන්දු | පැය 01 | 1,000.00 | 1,500.00 | 1,500.00 | 2,000.00 |
| කරාතේ | පැය 01 | 500.00 | 1,000.00 | 1,000.00 | 1,500.00 |
| වෙනත් වැඩසටහන් (යෝග , ඇරබික්ස් , සුම්බා) | පැය 01 | 500.00 | 1,000.00 | 1,000.00 | 1,500.00 |

**ක්‍රීඩා තරඟාවලි සඳහා**

| විස්තරය | කාලය | පාසල් | | ක්‍රීඩා සමාජ | |
|---|---|---|---|---|---|
| | | බල ප්‍රදේශයේ | පිටත | බල ප්‍රදේශයේ | පිටත |
| වොලිබෝල්/අත්පන්දු | වරුවක් | 6,000.00 | 10,000.00 | 8,000.00 | 14,500.00 |
| දැල් පන්දු | දිනකට | 10,000.00 | 15,000.00 | 12,000.00 | 18,000.00 |
| බැට්මින්ටන් | වරුවක් | 6,000.00 | 8,000.00 | 10,000.00 | 15,000.00 |
| | දිනකට | 10,000.00 | 12,000.00 | 15,000.00 | 20,000.00 |
| පැසි පන්දු | වරුවක් | 6,000.00 | 10,000.00 | 8,000.00 | 14,500.00 |
| | දිනකට | 10,000.00 | 15,000.00 | 12,000.00 | 18,000.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| කරාතේ | වරුවක් | 10,000.00 | 12,000.00 | 10,000.00 | 15,000.00 |
| | දිනකට | 15,000.00 | 20,000.00 | 20,000.00 | 30,000.00 |
| නැටුම් පංති | පැයකට | 750.00 | 1,000.00 | 1,000.00 | 1,500.00 |
| වෙනත් වැඩසටහන් (යෝග , ඇරබික්ස් , සුම්බා) | පැයකට | 750.00 | 1,000.00 | 1,000.00 | 1,500.00 |

**ශ්‍රීමත් ඇල්බට් පිරීස් පිහිනුම් තටාකයේ ගාස්තු අය කිරීම**

**පුහුණුවීම් සඳහා**

| | | |
|---|---|---|
| පාසැල් ළමයෙකු සඳහා | රු.250.00 | පැය 2ක් සඳහා |
| වැඩිහිටියෙකු සඳහා | රු.400.00 | පැය 2ක් සඳහා |

**පිහිනුම් තරඟාවලි සඳහා (දිනකට)**

| විස්තරය | ගාස්තුව | තැන්පතුව |
|---|---|---|
| බල ප්‍රදේශයේ පාසැල් තරඟාවලි සඳහා | 35,000.00 | 20,000.00 |
| බල ප්‍රදේශයෙන් පිටත පාසැල් තරඟාවලි සඳහා | 40,000.00 | 20,000.00 |
| බල ප්‍රදේශයේ වැඩිහිටි තරඟාවලි සඳහා | 40,000.00 | 25,000.00 |
| බල ප්‍රදේශයෙන් පිටත වැඩිහිටි තරඟාවලි සඳහා | 50,000.00 | 25,000.00 |

**සැ.යු :**

I. **අමතර පැයක් සඳහා අය කිරීම රු. 5000.00**

II. **ළමුන් = වයස අවුරුදු 18 ට අඩු වැඩිහිටි = වයස අවුරුදු 18 ට වැඩි**

III. **දිනක් = පැය 08 වරුවක් = පැය 4 විනාඩි 30**

## b. ගරු මන්ත්‍රී යෝජනා

i. දකුණු සිරිගම්පල සා.ආනා දෙව්මැදුර ඉදිරියෙන් ආරම්භ වී මල්ෆාම් මායිමෙන් අවසන් වන දිග මීටර් 200ක් සහ පළල මීටර් 6ක් වන මාවත "උෂාන් චමිඳු රණවිරු මාවත" ලෙස නම් කර දෙන ලෙසට ගරු මන්ත්‍රී කේ.එන්.සුදත් ජානක පෙරේරා මහතා විසින් යෝජනා කරන ලදී.

| |
|---|
| තීරණ අංක 15<br><br>දකුණු සිරිගම්පල සා.ආනා දෙව්මැදුර ඉදිරියෙන් ආරම්භ වී මල්ෆාම් මායිමෙන් අවසන් වන දිග මීටර් 200ක් සහ පළල මීටර් 6ක් වන මාවත "උෂාන් චමිඳු රණවිරු මාවත" ලෙස නම් කර දෙන ලෙසට ගරු මන්ත්‍රී කේ.එන්.සුදත් ජානක පෙරේරා මහතා විසින් ඉදිරිපත් කරඇති යෝජනාව ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. |

iii. 2022 වර්ෂය සඳහා පහත සඳහන් ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කර ඇති යෝජනා සංශෝධනය කිරීම සඳහා ගරු මහා සභා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

| අ/අ | කොට්ඨාසය | කොට්ඨාසය භාර ගරු | සංශෝධිත යෝජනාව |
|---|---|---|---|

| | | මන්ත්‍රීතුමා/තුමියගේ නම | |
|---|---|---|---|
| 01 | උල්හිටියාව | ගරු මන්ත්‍රිනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මිය | • උ/උල්හිටියාව ඔස්ටිස් දබරේරා මහතාගේ නිවස පාර<br>• උ/උල්හිටියාව විද්‍යාල මාවත 3වන අතුරු මාර්ගය<br>• උල්හිටියාව විද්‍යාල මාවත 7වන අතුරු මාර්ගය |
| 02 | බෝලවත්ත | ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා | • බ/අංගම්පිටිය ප්‍රජා ශාලාවට වැසිකිලි පද්ධතියක් ඉදි කිරීම<br>• බෝලවත්ත ගොන්සාල්වේස් විදුහලේ ගේට්ටුව සහිත ඉදිරි පිවිසුම ඉදි කිරීම<br>➢ සෘජු කොන්ත්‍රාත් යටතේ<br>• ෆ්රැන්කි මහතාගේ නිවස අසල මාර්ගය ප්‍රිමික්ස් කිරීම<br>• බ/අංගම්පිටිය ලී මඩුව අසල මාර්ගය ප්‍රිමික්ස් කිරීම<br>• බෝලවත්ත ඇලෙක්ස් මහතාගේ නිවස පාර ප්‍රිමික්ස් කිරීම |
| 03 | මොහොට්ටිමුල්ල | ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා | • ප/මොහොට්ටිමුල්ල සිටිගේට් ඉඩමේ ළමා උයනට ආසන 02ක ඔන්චිල්ලාවක් සහ ආසන 2 සීසෝ 02<br>• ප/දුම්මලකොටුව කටානවත්ත පරාක්‍රම මහතාගේ නිවස පාර තාර දැමීම<br>• උ/ඇටියාවල ජුඩ් මහතා පදිංචි තේක්ක වත්ත පාර තාර දමා සංවර්ධනය කිරීම<br>• ප/දුම්මලකොටුව ක්‍රිස්ටෝපර් මහතාගේ නිවස පාර තාර දමා සංවර්ධනය කිරීම |

ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව තමන් මහා සබා රැස්වීමට දින 10කට පමණ පෙර ලිපි යොමු කල බවත් එය න්‍යාය පත්‍රයට ඇතුලත් වි නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. එය න්‍යාය පත්‍රයට ඇතුළත් නොකලේ මන්දැයි තමාට දැන ගැනීමට අවශ්‍ය බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඒ සඳහා වෙනත් කරුණු යටතේ කාලය ලබා දෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| තීරණ අංක 16 |
|---|
| 2022 වර්ෂය සඳහා ඉහත සඳහන් ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කර ඇති යෝජනා සංශෝධනය කිරීම සඳහා ගරු මහා සභා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

## **04. කාරක සහා වාර්තා සලකා බැලීම.**

i. 2022.08.23 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සලකා බැලීම.

මෙම වාර්තාවේ අංක 19 යටතේ වැසිකිළි ආධාර බෙදා දීම පිළිබඳව සඳහන් වන බවත් ,එම මිල ගණන් ඉදිරිපත් කිරීමේදී එහි එකතුව පහතින් සඳහන් කර තිබෙන්නේ මන්දැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.එහිදි එක් එක් කැබැල්ලේ වටිනාකම තිබෙන බවත්, එකතුව නොතිබුණේ නම් නිවැරදි බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

අදාල වටිනාකම ඉල්ලුම්කරුට ලබා දීමට කටයුතු කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙතැන අඩුම වටිනාකම තිබෙන පුද්ගලයාව පෙන්වන බවත්, නමුත් ද්‍රව්‍යය වල අඩුවැඩි වශයෙන් ආයතන වල සඳහන් වී තිබෙන බවත්, සමස්ථ වටිනාකම දැමීම වරදක් බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම වැසිකිලි ඉදි කර ඇත්දැයි විගණනයෙන් පැමිණ නිරික්ෂණය කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව අවසානයේදී මෙහි එකතුව දමා තිබෙනුයේ ද්‍රව්‍ය වල මිල ගණන් ආයතනයෙන් ආයතනයට වෙනස් බැවින් අඩු මුදල බලා ද්‍රව්‍ය ගැනීමට එක් එක් ආයතනයට යාමට නොහැකි බැවින් එකතුවක් ලෙස ගත් විට මධ්‍ය අගය සොයා එතැනින් මිල දී ගැනීමට හැකි බව ප්‍රකාශ කරන ලදී.

වැසිකිළි පෝච්චි නම් එකක් පමණක් යන බවත්, නමුත් සිමෙන්ති, බ්ලොක්ගල් ගත් විට එකක් නොව යම් ප්‍රමාණයක් යන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

උපරිම රු.40,000ක් පමණක් එක් අයෙකුට ලබාදෙන බවත්, මෙහිදී උපාංග වල මිල ගනන් දමා තිබෙන බවත් ලේකම්මහතා ප්‍රකාශ කරන ලදී.

වැසිකිළි ආධාර ලබා දීමේදී බලෙන් ලබා නොදෙන ලෙසත්, එය ප්‍රතිලාභියාට අවශ්‍ය ද්‍රව්‍ය ලබා දෙන ලෙසත් වැලි නම් වැලි ලබාදෙන ලෙසත් එවිට ඉතිරි කොටස ප්‍රතිලාභියාට සිදු කර ගෙන යාමට ඉඩ ලබා දෙන ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

එය අනිවාර්යයෙන්ම සෑදීමට පෙර හා පසුව පරීක්ෂා කර බැලිය යුතු බවත්,ඒ් පිලිබඳව වාර්තාවක්ද ලබා ගන්නා ලෙසට යෝජනා කරන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

| තීරණ අංක 17 |
|---|
| 2022.08.23 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරී අයිරංගනී පෙරේරා මහත්මියගේ සහ ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ගරු මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

ii. 2022.08.09 වන දින පැවති ක්‍රීඩා සංවර්ධන හා ප්‍රජා සංවිධාන ශක්තිමත් කිරීමේ කාරක සභා වාර්තාව සලකා බැලීම.

| තීරණ අංක 18 |
|---|
| 2022.08.09 වන දින පැවති ක්‍රීඩා සංවර්ධන හා ප්‍රජා සංවිධාන ශක්තිමත් කිරීමේ කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ සහ ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම |

| |
|---|
| වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

මෙම කාරක සභාවේදී කතා කල කාරණාවක් පිළිබඳව කතා කිරීමට තමන් සූදානම් වූ බවත්, ස්ථිර කල පසුව කතා කර තේරුමක් නොමැති බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

සංශෝධනයක් තිබේනම් ඉදිරිපත් කිරීමට හැකි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගනයේ මිල ගණන් වැඩි වීම සම්බන්ධයෙන් අද දින ලැබුණ බවත් පාසල් දරුවන්ගේ කොටස පමණක් හෝ වැඩි නොකරන ලෙසත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.ගියවර මහා සභාවට තමන් සහභාගි නොවූ බවත් නමුත් ක්‍රීඩාවේ උන්නතිය පිළිබඳව ඉතාමත් උද්යෝගයකින් කතා කර තිබූ බවත් එහිම ප්‍රතිවිරුද්ධ ලෙස මෙම මිල වැඩි කර තිබෙන බවත් පාසල් දරුවන්ගේ ගාස්තු වැඩිනොකරන ලෙසට ඉල්ලීමක් සිදු කරන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව අවශ්‍ය දෙයක් බවත් නමුත් දැනට ක්‍රීඩා කමිටුව මඟින් 2023 වර්ෂය සඳහා මිල වැඩි කිරීමට යෝජනාවක් ගත් බවත් ප්‍රකාශ කරන ලදී. මිල වැඩි කිරීම සම්බන්ධයෙන් සැපයුම් නිලධාරී විසින් වාර්තාවක් ඉදිරිපත් කරතිබෙන බවත්, ඒ අනුව පවිත්‍රකාරක ද්‍රව්‍ය මිල 75%කින් මිල වැඩි වීමක් තිබෙන බවත් විශේෂයෙන්ම මෙම ගැටළුව පිහිණුම් තටාකය සඳහා තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.මෙම මුදල රු.300ක් රු.400 පමණ කිරීමට සිදු වන බවත්, නමුත් දරුවන්ටද පහසුකම් සැපයිය යුතු බවත්, මේවා පවත්වාගෙන යාමට හැකියාවක් නොලැබෙන බවත් මේවා 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කරඇති බැවින් සංශෝධනය කිරීමටද හැකියාව තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. නමුත් වත්මන් වාතාවරණය අනුව රු.500ක් දක්වා වැඩි කිරීමටද ඉදිරියේදී සිදුවේවියැයිද ප්‍රකාශ කරන ලදී.අඩු කිරීම් සම්බන්ධයෙන් කතා කලද වැඩි කර තිබෙනුයේ ඉතාමත් සුළු ප්‍රමාණයක් බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.
පෞද්ගලික ස්ථාන වල පිහිණුම් තටාකයේ ගාස්තුව රු.350 ක් 500ක් පමණ වන බවත් මෙය සාධාරණව වැඩි කර තිබෙන බවත්, අඩුආදායම්ලාභී දරුවෙකුට තමා හමුවිය හැකි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

යම් හෙයකින් අපහසුතාවයක් තිබෙන දරුවෙකු සිටී නම් ගරු සභාපතිතුමාව හමුවිය හැකි බවත් එතුමා මැදිහත් වී නිදහස් කරාවියැයිද ගරු මන්ත්‍රීවරුන්ගේද විරෝධතාවයක් ඒ සඳහා නොමැති බවත් ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

පොදුවේ පිහිණුම් තටාකය ගත් විට ඒ සඳහා හොඳ වාහනවලින් පැමිණෙන දරුවන් සිටින බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

iii. 2022.08.05 සහ 2022.08.19 වන දින වල පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තා සලකා බැලීම

| |
|---|
| තීරණ අංක 19<br><br>2022.08.05 සහ 2022.08.19 වන දින වල පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රීකේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතාගේ සහ ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාතාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

iv. 2022.08.19 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභා වාර්තාව සලකා බැලීම

තමාට ලැබී තිබූ දිනයට වීථි පහන් නඩත්තුව සඳහා නොපැමිණි බවත්, පසුගිය දින දහවල් එකට පමණ පැමිණි බවත් උදෑසන සිට තමන් රාජකාරි පසෙකලා ඒ වෙනුවෙන් බලා සිටි බවත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී. ඒ වෙනුවෙන් ගරු සභාපතිතුමා වෙනත් දිනයක එය ලබා දුන් බවත් එයට ස්තුතිවන්ත වන බවත් නමුත් එය නිවැරදි කරන ලෙසට නිලධාරීන්ට පවසන ලෙසටත් ඉල්ලා සිටින ලදී.

එදින ඩීසල් නොතිබුණ බවත්, ඉතාමත් අපහසුවෙන් මෙම වැඩ කටයුතු සිදු කරන බවත්, සභාවටද ඩීසල් ලීටර් 20ක් පමණක් ලැබෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ජනතාව විසින් මන්ත්‍රීවරුන් පත් කර එවන බවත්, මන්ත්‍රීවරුන් අපහසුතාවයට පත්වනවා යනු ජනතාවද අපහසුතාවයට පත් වීම බවත් එබැවින් හරි වේලාවට එය එවන ලෙසට ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී. කෙදිනකවත් අතරමැදින් බල්බයක් හදා ගැනීමට නොහැකි වූ බවත්, වෙනත් කොට්ඨාස වල ඕනෑ තරම් එය සිදු කරන බවත් රියදුරන්ට ඕන විදියට වැඩ කිරීමට නොහැකි බවත් ලේකම්මහතා එය බැලිය යුතු බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතාගේ කතාව නිවැරදි බවත්, මේ කාරණාව පිළිබඳව අදාල මන්ත්‍රීවරයාව උදෑසන දැනුවත් කරන ලෙසට ගරු මන්ත්‍රී ඒ..එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම වාර්තාවේ දෙවන පිටුවේ වෙනත් ඉල්ලීම් යටතේ " විදුලි බල්බ අවශ්‍ය ප්‍රමාණය කොට්ඨාසයේ මන්ත්‍රීගේ අවශ්‍යතාවය මත ලබා දිය යුතු බවට ගරු මන්ත්‍රීනී ජේ.කේ. දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය විසින් යෝජනා කරන ලදී" ලෙස සඳහන් වන බවත්, එලෙස වාර්තාවේ සඳහන් නොකරන ලෙසත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

වීථි පහන් සම්න්ධයෙන් නීතිමය තත්ත්වයකට යන ලෙස ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා විසින් පසුගිය මහා සභාවේදී පැවසූ බවත්, එය සඳහා මේ වන විට අවශ්‍ය පියවර ගෙන තිබේද යන්න ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා විසින් විමසා සිටින ලදී.

තවමත් කණු වලින් 80% පමණ CFL බල්බ ගැලවෙන බවත්, එක් කොට්ටාසයකට බල්බ 05ක් පමණ LED තවමත් ගැලවෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.
බල්බ ලබා ගැනීමේදී හොඳ ආයතනයකින් එය ලබා ගන්නා ලෙස ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.

නීතිමය තත්ත්වයද සලකා බැලිය යුතු බවත්, ලබන වසරේදී හවුල්කරුවන්ගෙන් නොගෙන අදාල ආයතනයෙන්ම ගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මාසයට එක් දිනක් පමණක් අළුත්වැඩියාවට පැමිණෙන බවත්, එවිටත් අඩුපාඩු සහිතව පැමිණෙන බවත් නැවත මාසයක් යන විට ජනතාව දෝශාරෝපණය කරන බැවින් අවශ්‍ය ද්‍රව්‍ය සමඟ අළුත්වැඩියාවට වාහනය එවන ලෙසට ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

| තීරණ අංක 20 |
|---|
| 2022.08.19 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ සහ ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

v. 2022.08.25 වන දින පැවති පරිසර හා මහජන සෞඛ්‍ය පහසුකම් කාරක සභා වාර්තාව සලකා බැලීම

| තීරණ අංක 21 |
|---|

2022.08.25 වන දින පැවති පරිසර හා මහජන සෞඛ්‍ය පහසුකම් කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතාගේ සහ ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

සෙන්දිරියාමුල්ල කොම්පෝස්ට් අංගණයේ සම්පූර්ණ වාර්තාවක් මහා සභාවට ඉදිරිපත් කිරීමට තමන් සූදානම් වන බව පරිසර කමිටුවේ සභාපති ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. රු.8,639,213.82ක කොටසක් වැඩ නිමවා ඇති බවත්, 31.75%ක වැඩ අවසන් කර තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.ගෙනෙන කසල කොම්පෝස්ට් බවට පත් කිරීමට වහලය ගැසීමට සිදු වන බවත් වහලය ගසා අවසන් කරගතහොත් එම කටයුතු සිදු කිරීමටද හැකි බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

සභාවෙන්ද එය සිදු කරන ලෙසට අනුමැතිය ලබා දුන් බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

දංකොටුව ප්‍රදේශයේ කසල කිරිමැටියානට නොගෙනගොස් ඒවා මෙම ස්ථානයට ගෙනැවිත් පොලිතින් උර ගෙන වසා මෙය සිදු කරමුයැයිද,ඒවා වෙන් කල කසල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එහිදි ජනතාවගෙන් ප්‍රශ්නයක් පැමිණීමට හැකි බව ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදි. 1987 පණත අනුව බදු මුදල් අය කරන බවත්, සති අන්තයේ කුකුල් මස් විකුණන පුද්ගලයාගේ සිට මහා පරිමාණයේ දිනකට කිලෝ 30,000 පමණ විකුණන පුද්ගලයාගෙන්ද අප එකම මුදල අය කරන බවත් ඒවා සංශෝධනය කරන ලෙසත් ඉල්ලා සිටින ලදි. අනෙක් ගැටළුව දුරකථන කුළුණු බවත්, සමස්ථ බදු සංශෝධනයක් යෝජනා කරන බවත්, මේවා ඉහළට ඉදිරිපත් කරන ලෙසත් ඉල්ලා සිටින ලදී. එමෙන්ම ගලි රථ වලට විශාල පිරිවැයක් දරන බවත්, දංකොටුව මාළු මාකට් එකේ අප ජලය ගෙන යාමට විශාල පිරිවැයක් දැරීමට සිදු වී තිබෙන බවත්, මාළු සේදූ ජලය ස්ව කැමැත්තෙන්ම පොල් වතු වලට ගැනීමට කැමති නම් එය ලබා ගන්නා ලෙසත්, ඉවත් කිරීමට ක්‍රමවේදයක් සකස් කර ගන්නේ නම් එම පිරිවැය අඩු කරගත හැකි බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම තොප්පුව සනීපාරක්ෂක ඒකකයේ අප ජලය ගබඩා කරන ධාරිතාවය මදි බවත් එම ධාරිතාවය වර්ධනය කර එම පිරිවැයද අඩු කරගැනීමට හැකි බවත් පොදුවේ බදු සංශෝධනය කඩිනමින් සිදු කර ඊළඟ මහා සභාවට ප්‍රගතිය වාර්තා කරන ලෙසටද ඉල්ලා සිටින ලදී.

## <u>05.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම.</u>

**i. මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය -2022 ජූලි**

**ii. මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය -2022 ජූලි**

ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව වරිපනම් එකතු කිරීම පිළිබඳ ප්‍රගතියක් තිබෙන බවත්,වාර්ෂිකව එක්කෝටි අනූහය ලක්ෂයක් එකතු විය යුතු බවත් ජූලි මාසය වන විට එක්කෝටි එකොලොස් ලක්ෂ පමණ මුදලක් එකතු වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 22

2022 වර්ෂයේ ජූලි මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ 2022 වර්ෂයේ ජූලි මස ඒකාබද්ධ ගෙවීම් සාරාංශය පිළිබඳ වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය

iii. 2022 අගෝස්තු මස ඉන්ධන හා අළුත්වැඩියා වෙනුවෙන් වියදම් වූ වාර්තාව සලකා බලන ලදී.

ඉන්ධන මිල ගණන් සමඟ ගරු සභාපතිතුමාගේ ඉන්ධන සඳහා ප්‍රතිපාදන ප්‍රමාණයද වැඩි කරගැනීමට සිදුවෙයැයිද ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා මෙම අවස්ථාවේදී ප්‍රකාශ කරන ලදී

iv. 2022 වර්ෂයේ අගෝස්තු මස වීථි පහන් නඩත්තු කිරීම පිළිබඳ ප්‍රගති වාර්තාව සලකා බලන ලදී.

## 06. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම.

(i). මාසික ප්‍රගතිය ඩිජිටල් තිරයේ ඔස්සේ ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

(ii).වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට අයත් දංකොටුව වෙළඳ සංකීර්ණයේ පළමු අධියරයේ කඩ කාමර පද්ධතියට අවහිරයක්ව පවතින ගොඩනැගිල්ල සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම.

එක් කොටසක් වැසීම නිසා මුදල් එකතු වීමද අඩු වී තිබෙන බවත්,මැද කොටස ඉවත් කරමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

බිත්ති ටික ඉවත් කර කණු ටික තබමුයැයිද,මේ පිළිබඳ වාර්තාවක්ද කැඳවමුයැයි එමෙන්ම දැනට ගිවිසුම්ගත වී තිබෙන උදවියට ගිවිසුම්ගත නොවී ත්බෙන කඩ කාමරයක් ලබා දෙමුයැයිද ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

පළමුව ටෙන්ඩර්ගත් පිරිසව සම්බන්ධ කරගෙන සාකච්ඡා කර එකඟතාවයකට එමුයැයි ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

එළවළු කඩ ටික වෙනත් ස්ථානයකට ගැනීමට ඔවුන් කැමති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමාගේ යෝජනාව කුමක්දැයි ගරු මන්ත්‍රී ඩී.එල්. අමල් සුරංග මහතා විමසා සිටින ලදී.

අඩ සඳ ලෙස තිබෙන මැද කොටස ඉවත් කර දැමීම බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තාක්ෂණ නිලධාරි යවා පරීක්ෂා කරන ලෙසත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහි වාර්තාවක් ඊළඟ මහා සභාවට ඉදිරිපත් කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සෑම විටම කෑ ගසනුයේ එළවළු මාකට් එක පිළිබඳව බවත්, එම කඩ 12,13 ඉවත් කර ස්ථාපිත කිරීමට පොළ අයිනෙන් ඉඩ සලසා දෙන ලෙසද ගරු මන්ත්‍රී ඩී.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

ඇත්තෙන්ම මෙම ගොඩනැගිල්ලේ කඩ සාදා එළවළු වෙළඳුන්ට ලබා දීමට සූදානම් වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එහිදී එම කඩ කාමර වෙනත් අයට ලබා දී එම කඩ පිරිසව පොළට දැමූ බවත්, පොළ සෑදීමේදී දැන් තිබෙන ස්ථානයට දැමූ බවත්, නැවතත් වෙනත් තැනකට දමාවියැයිද කඩ පේළිය ස්ථාපිත කර දුනහොත් පිළිවෙලට එය පවත්වාගෙන යාමට හැකි වන බවද ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

තම හිතවතෙකුගේ කඩයක් සම්බන්ධව ගැටළුවක් තිබූ බවත් ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා ප්‍රකාශ කරන ලදී.එහිදී මෙම කඩ කාමර ගබඩා ලෙස යොදාගෙන ලොරිරථ පැමිණ

මෙතැන අවහිර කරන බවත්, කඩහිමියන්ට කඩ පවත්වා ගෙන යාමට නොහැකි වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.හිටපු සභාපති ගරු ට්‍රෙවින් ප්‍රනාන්දු මහතා සභාපති වී සිටියදී ගිවිසුමකට පැමිණ තිබෙන බවත් ඉන් පසුව ගරු සභාපතිතුමා ගේ කාලයේදී මුදල් දී තිබෙන බවත් දින වකවාණුද පැහැදිලි නොමැති බවත් හැකියාවක් තිබෙන අයිතිකරුවන් නඩු මහට යාමට සූදානමින් සිටින බවත් මේ පිළිබඳව දිගින් දිගටම වසර ගණනාවක් කතා කල බවත් ජනතාව මුදල් වැය කර තිබෙන බවත් මේ සියල්ල සලකා බලා තීරණයක් ගන්නා ලෙසටද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 23<br><br>වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට අයත් දංකොටුව වෙළඳ සංකීර්ණයේ පළමු අඩියරයේ කඩ කාමර පද්ධතියට අවහිරයක්ව පවතින ගොඩනැගිල්ල සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාවක් ගෙන එය ඊළඟ ගරු මහා සභාවට යොමු කිරීම සුදුසු බවට තීරණය කරන ලදී. |

(iii) ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව තම කොට්ඨාසයේ ජනතාවගේ අවශ්‍යතා කීපයක් තිබෙන බවත්, ඒ සම්බන්ධව ලේකම්මහතාටද පවසා ඇති බවත්, සභාවේ සභිකයෙකු යම් අදහසක් ඉදිරිපත් කල විට එය සලකා බැලිය යුතු බවත්, තමන්ද දෙවතාවක් සභාවේ සභිකයෙකු ලෙස සේවය කල බවත් ප්‍රකාශ කරන ලදී. තමන් දන්නා පරිදි මහා සභාවට යොමු කල යුතු යෝජනා ලේකම්තුමාට යොමු කල යුතු බවත්, එම නිසා ලේකම්තුමාටද විෂය සිදු කරන නිලධාරී වෙතද විද්‍යුත් මාධ්‍යයෙන් මෙන්ම ගෙනැවිත්ද භාර දුන් බවත් ප්‍රකාශ කරන ලදී. රාජ්‍ය සේවයේ ඉහළ නිළධාරියෙකු ලෙස ලේකම් මහතා පියන්කෙනෙකු නොවී ලේකම්වරයෙකු ලෙස කටයුතු කරන ලෙසටද කාරුණිකව ඉල්ලා සිටින බවද තවදුරටත් ප්රකාශ කරන ලදී. මෙය න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට තමාට අවශ්‍ය වූ බවත්, ගරු සභාපතිතුමා සමඟ ගැටළුවක් නොමැති බවත් තමන් පැවසූ කාරණා බොහෝමයක් ඉටු කර ඇති බැවින් ස්තුති කිරීමට තමාට අවශ්‍ය වූ බවද ප්‍රකාශ කරන ලදී. තමන්ට වත්මන් ආර්ථික තත්ත්වය හා කොවිඩ් තත්ත්වය, එමෙන්ම තෙල් ප්‍රශ්නය පිළිබඳව අවබෝධයක් තිබූ බවත්, තමන් පැවසූ වැඩවල එකතුව ලක්ෂ 06ක් 07ක් පමණ වන බවත් තමන් පවසනුයේ මිනී පිටියේ තණකොළ ටික කපා දෙන ලෙසත් ධම්මවිජයේ වලවල් ටික වසාදෙන ලෙසට පවසන බවත් ඒවා සිදු නොකරන විට කිසිවෙකු ලේකම්මහතාටවත්,වැඩ පරිපාලක මහතුන්ටවත්, බලයලත් නිලධාරීන්ටවත් කිසිවෙකු දොස් නොපවසන බවත් ප්රකාශ කරන ලදී. මෙම සභාවේ සේවක මණ්ඩලය 360 සිටින බවත්, කම්කරුවන් 85ක් සෞඛ්‍ය කම්කරුවන් 103 සිටින බවත් මෙම කාර්යාල ඇතුළත නඩත්තු වන විශාල සේවක පිරිසක් සිටින බවත් වැටුප් ලෙස සෑම මසකම ලක්ෂ එකසිය තිහකට ආසන්න මුදලක් ලබා ගන්නා බවත්, වැටුප් ලබා ගත යුතු බවත් නමුත් එලෙස විශාල මුදලක් වැටුප් ලෙස ගැනීමේදී සභිකයෙකු ලෙස තමන්ද මෙම ප්‍රදේශයේ ජනතාවද විශාල වැඩ කොටසක් බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරන ලදී. මහා සභාව කියනුයේ ප්‍රතිපත්තිමය තින්දු ගන්න තැනක් බවත්, වරිපනම් ගැසට් කරනවද නැද්ද තීන්දු කරන තැනක් බවත් එය ඉටු කිරීම සඳහා සේවකයින් වැටුප් ලබා ගන්නා බවත් කිසි දිනක සිංගක්කුලියේ සිට ඉහළට යන තෙක් පාරවල් වල වලවල් නොවසන බවට කිසි දිනක ප්‍රතිපත්තිමය තීන්දුවක් ගෙන නොමැති බවත්, එමෙන්ම මාස 08ක් ගත වී සොහොන් කොත් වැසී යන තෙක් සතුන් බෝ වන තෙක් තණකොළ නොකපන බවට තීන්දුවක් ගෙන නොතිබුන බවත් ප්‍රකාශ කරන ලදී. කාර්ය මණ්ඩලය ලෙස ගරු සභාපතිතුමාට දිය හැකි සහයෝගය නම් මෙම කටයුතු කර ගෙන යාමට සහය වීම බවත් තමන් කතා කර සේවකයින් ඉල්ලීමේදීද ගරු සභාපතිතුමා පවසන දෙය නොඅසන පිරිසක් සිටින බවත් ඔවුන් මන්ත්‍රීතුමා පවසන දෙය අසාවිදැයි පැවසූ බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. යෝගියාන ඇටියාවල පන්සලේ හාමුදුරුවන්ගේ අපවත් වීමත් සමඟ සියලු වැඩ කටයුතු ආවරණය කර දුන් බවත් ඒ සඳහා ස්තුති වන්ත වන බවත් ප්‍රකාශ කරන ලදී.මහා සභාවක් ලෙස ගරු සභාපතිතුමා සමඟ සියළු දෙනා වසර ගණනාවක් වැඩ කටයුතු කල බවත්, මන්ත්‍රීවරු ලෙස සිටිමේදී ජනතාව සියළුම ගැටළු පවසන බවත්,ජනාධිපති අගමැති මරපුවහම ඔක්කොම හරියනවා,දේශපාලන ප්‍රහාර ආවහම 225ම මරන ලෙස පැවසුවත් එය හරියන්නේ නැති බවත්, එය හරියන්නේ නැත්තේ මෙම සභාවේද සෑම මසකම ලක්ෂ එකසිය තිහක් පමණ පඩි ලබා ගන්නා බවත් එමෙන්ම අතිකාල ලබා ගන්නා බවත්, වාහන 05ක් ගමන් කරන බවත් ප්‍රකාශ කරන ලදී. තමන් තණකොල කපන සිසිරට ජංකුරාවෙල් මිනිපිටියේ තණකොල කැපීමට පැමිණි විට එහා පසින් ඇති මිනී පිටියේ තණකොල කපන ලෙසටද පැවසූ බවත් එහිදී ඔහුට ඩීසල් ලීටර් 20ක් පමණක් ලබාදෙන බව පැවසූ බවත් එබැවින් තවත් දිනයක එයට පැමිණිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.ගරු සභාපතිතුමා බල

ප්‍රදේශය පුරා සැරිසැරිය යුතු බවත් නමුත් වාහන 05ක් සැරිසැරිය යුතු නොවන බවත් ලක්ෂ 15ක ඩීසල් ගසනා බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. ගිය වසරේ වාර්තාද තමන් සලකා බැලූ බවත් ලොකුවට වෙනසක් නොමැති බවත් තෙල් නොගසන ලෙසට නොපවසන බවත්, ලේකම්මහතාට, වැඩ පරිපාලකලාට ,බලයලත් නිලධාරීන්ට ප්‍රදේශය පුරා ගොස් අධීක්ෂණය කිරීමට සිදු වන බවත් මෙහිදී තෙල් නොගසන ලෙස නොව තමන් පවසනුයේ සභාවෙන් ඉන්ධන,අතිකාල හා වැටුප් සඳහා දරා ඇති වියදම පිළිබඳව බවත් තමන්ද රජයේ නිලධාරියෙකු බවත් ප්‍රකාශ කරන ලදී. කෘෂිකර්ම අමාත්‍යාංශයේ පොහොර නැව සම්බන්ධයෙන් පසුගිය දින දුටු බවත් එහි අවසන් තීන්දුව ලබාදී තිබෙනුයේ නිලධාරීන්ට බවත් මෙම ක්‍රියාපටිපාටියේ වරද කරනුයේ නිලධාරීන් බවත් දේශපාලනික වශයෙන් කාබනික පොහොර ගෙනෙන බවට හරි හෝ වැරදි චේවා ප්‍රතිපත්තිමය තීන්දුවක් ගෙන ඇති බවත්, නමුත් එය ක්‍රියාත්මක කරනුයේ අමාත්‍යාංශ ලේකම්වරයා හා අනෙක් පිරිස බවත් ප්‍රකාශ කරන ලදී. හිටපු පාර්ලිමේන්තු අමාත්‍යවරයාද නැඟිට එතුමා මේ පිළිබඳව නොදන්නා බව පැවසූ බවත්, එවිට මෙහි පිටත ආවරණය වන බවත් පිටතින් මන්ත්‍රීවරු හොරා කනවා සල්ලි ගන්නවා පාරේ පැච් වහන්නේ නෑ, තණකොළ ටිකක් කපන්නේ නෑ යැයි පවසන බවත් නමුත් මන්ත්‍රීවරුන්ට සම්බන්ධ වන කාර්ය මණ්ඩලය කෙතරම් සිටියද කම්කරුවන් හය හත්දෙනෙකුට වඩා වැඩ කරනවා තමන්ද දැක නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. වැඩ කරන පුද්ගලයා මැරීගෙන වැඩ කරන බවත් වැඩ නොකරන කෙනා වැඩ නොකරනම බවත් මෙය දේශපාලනික වශයෙන් සිදු කරන ප්‍රහාරයක් නොවන බවත් මෙය සියළුම මන්ත්‍රීවරුන්ට බලපාන කාරණාවක් බවත් එබැවින් තමන් මෙම අදහස් ඉදිරිපත් කල බවත් මෙලෙස හෝ අවස්ථාවක් නොලැබුනොතින් ජනතාවට මෙය පැවසීමට සිදු වන බවත් පුද්ගලිකව තොරතුරු සෙව්වා මිස මෙය ප්‍රසිද්ධ නොකල බවත් පත්තරයකට වුවද මෙය ලියා දැමීමට තිබූ බවත් ප්‍රකාශ කරන ලදී. දුම්මලදෙණිය මැක්සීස් ආයතනය අසල පාර ඉතාමත් අබලන් වී ඇති බවත්, එමෙන්ම ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතාගේ නිවස පාරද එලෙසම සිදු වීඇති බවත් තමන් මේවා දුටු බවත් ,පලාත් පාලන පණතේ මාර්ග සංවර්ධනය , කසල කලමණාකරණය සෞඛ්‍ය සේවා මේවා ප්‍රධාන වැඩ බවත්,මෙම සභාවේදී දුටු ඡායාරූප සමඟ බැලීමේදී විශාල වැඩ කොටසක් සිදු කර තිබෙන බවත් නමුත් අප මුලින්ම සිදු කල යුතු වැඩ කොටසක්ද තිබෙන බවත් මධ්‍යම ආණ්ඩුවට පලාත් සභාවට විවිධ වැඩ කොටස් ලබා දී ඇති බවත්, එලෙසම පලාත් පාලනයටද වැඩ කොටසක් ලබා දී ඇති බවත් අප විසින් ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගෙන ඇති බවත් අද වන විට පාර දෙපසින් බයිසිකල් දෙකක්වත් යාමට නොහැකි තත්ත්වයට පත් වී ඇති බවත් මේවා ගැටුම් බවට පත් කර ගත යුතු නොවන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. ගරු සභාපතිතුමාට ලැබුණු තොරතුරු සමඟ හෝ අද වන විට ධම්මවිජය පාරේ වලවල් සකස් කර ඇති බවත් අද වන විට ආදාහනාගාරය මිනී පිටිය සුද්ද කරන බවත්, එමෙන්ම වීජී පහන් සකස් කිරීමේදීද බලයලත් නිලධාරීන් හරහා තොරතුරු රැස්කර මෙම කාරණා ඉටු කරන ලෙසත් මන්ත්‍රීවරයා යනු අවශ්‍ය ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගැනීමටත් එතැන වරදක් සිදු වන්නේ නම් එයට අවශ්‍ය සහය දෙන පුද්ගලයෙකු බවත් ප්‍රකාශ කරන ලදී.ගරු සභාපතිතුමාට සෑම වේලාවකම සහයෝගය ලබා දී ඇති බවත්, ඉදිරියේදීද සහයෝගය ලබාදෙන බවත් නමුත් මන්ත්‍රීවරුන් ලෙස ජනතාවට මුහුණ දීමට සිදු වන බවත්, මෙමඟින් ඉටු වූ වැඩ කටයුත්තක් තිබෙන බවත් එබැවින් ඉදිරි කටයුතු පිළිබඳව සිතා බලා මන්ත්‍රීවරුන්ගෙන් ඉවත් කල යුතු දෙයක් තිබේනම් ඉවත් කර ගතයුතු දෙයක් ඇත්නම් එයද ගන්නා ලෙසත් තමන් කිසිදු බලාපොරොත්තුවක් ඇතිව මෙය නොපවසන බවත් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා සිටින ලදි. එමෙන්ම විශේෂයෙන් මන්ත්‍රීවරයෙකු ලිඛිත ඉල්ලීමක් කරන විට එය වාර්තා කරන ලෙසත් ඉල්ලා සිටින ලදී. ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් සහ ලේකම්මහතාගෙන් ඉතාමත් කාරුණිකව ඉල්ලන බව පවසමින් තම කතාව අවසන් කරන ලදි.

(iv).ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව ශෝක යෝජනාවක් සභාගත කිරීමට තිබෙන බව පවසා සිටින ලදී. වෙන්නප්පුව සුළු නගර සභාවේ හිටපු ගරු සභාපති එමෙන්ම දෙවතාවක් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ හිටපු ගරු මන්ත්‍රී සිඩ්නි ජෝන් ප්‍රනාන්දු මැතිතුමා පසුගිය දිනවල අභාවප්‍රාප්ත වූ බවත්, එතුමා දේශපාලන වශයෙන් විශේෂයෙන්ම වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව නියෝජනය කරන වකවානුවේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ වාමාංශික කඳවුර නියෝජනය කරමින් මේ සභාවට තේරි පත් වූ බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම නාත්තන්ඩිය ආසනය තුළ ගරු සිරිමාවෝ බණ්ඩාරණායක මැතිණියගේ ආශිර්වාදය තුළ කෙටි කලක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායක ධුරය දරන්නට කටයුතු කල බවත් ප්‍රකාශ කරන ලදී. තමන් දන්නා පරිදි එතුමා කොළඹ ශා.ජෝෂප් විද්‍යාලයේ අධ්‍යාපනය ලබා ඇති බවත්, ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතාගේ ආදරණීය පියාණන් ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු මැතිතුමා සමඟ යුහුසුළුව කටයුතු කල බවත්එවිට තමාටද

එතුමාව හඳුනා ගැනීමට හැකිවූ බවත් ප්‍රකාශ කරන ලදී.එමෙන්ම 1991 වසරේදී මෙම සභාව නියෝජනය කිරීමට පැමිණි අවස්ථාවේදී විපක්ෂයෙන් පැමිණි කණ්ඩායමේදී එතුමා තුන් වෙනියට අසුන්ගත බව තමාට මතක බවත් ප්‍රකාශ කරන ලදී.මෙහි ගරු මන්ත්‍රීවරුන්ද බහුතරයක් අධ්‍යාපනය ලැබූ ශා.ජෝෂප් වාස් විද්‍යාලයේ සකරියස් ශාලාව ඉදි කෙරුවේද ගරු සිඩ්නි ප්‍රනාන්දු මැතිතුමාගේ පියාණන් යන කරුණු කාරණාද තමන් දන්නා බවත් එබැවින් සුවිසල් මෙහෙවරක් කල එම පවුලේ සාමාජිකයෙකු ලෙස එමෙන්ම දංකොටුව ප්‍රදේශයේද එතුමාගේ ඥාති සමූදායක් සිටින බවත් ප්‍රකාශ කරන ලදී.මෙතුමා ඉතාමත් අහිංසක ගති පැවතුම් ඇති නිව්ච්ච පුරවැසියෙකු ලෙස සභාවේ වාද විවාද තුලදී වූවද එතුමා අදහස් ඉතාමත් ගාම්භීරව ප්‍රකාශ කරපු මන්ත්‍රීවරයෙකු බවත් එතුමා සුළු නගර සභාවේ සභාපතිවරයා ලෙස වෙන්නප්පුව මහජන පුස්තකාලයද නිර්මාණය වූවානම් එම ගොඩනැඟිල්ලද එතුමාගේ ධූර කාලය තුළ සිදු වූ බවත් ප්‍රකාශ කරන ලදී.එදා මෙදා තුර එතුමාගේ ඒ කාල පරාසය තුළ දේශපාලන වශයෙන් එතුමා යමක් ඉතිරිකල පුද්ගලයෙකු ලෙස සභාවේ සඳහන් කරන බවද පවසමින් මෙම ශෝක පණිවිඩය එතුමාගේ ඥාතීන් වෙත යවන ලෙසට යෝජනා කරමින්ද තම කතාව අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව අභාවප්‍රාප්ත සිඩ්නි ජොන් ප්‍රනාන්දු මැතිතුමාගේ අභාවය පිළිබඳව අපගේ ප්‍රාදේශීය සභාවේ ශෝකය ප්‍රකාශ කරන අතර එතුමා ඇත්තට කෘතහස්ථ දේශපාලඥයෙක්, කෘතහස්ථ සමාජ සේවකයෙක්, කෘතහස්ථ පවුල් පරම්පරාවකින් එන පුද්ගලයෙක් බවත් ප්‍රකාශ කරන ලදී. එතුමාගේ දේශපාලන ජීවිතයේදීත් සමාජයේ සමාජ වැඩ කටයුතු වලදීත් නායකත්වයක් ගත් එතුමා වෙන්නප්පුව සුළු නගර සභාවේ සභාපති ධූරය හෙබවූ බවත්, වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ මැතිවරණයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තරඟ කර විපක්ෂයට එකතු වූ කණ්ඩායමේ එතුමා සිටි බවත් ප්‍රකාශ කරන ලදී.එතුමා කිපෙන සුළු පුද්ගලයෙකු නොවන බවත්, ඉතාමත් විචක්ෂණශීලීව ප්‍රශ්න වලට උත්තර සපයන එවාගේම හුගාක්ම දූක හඳුනන ඉතාම ගරු කල යුතු මහත්මයෙක් ලෙස එතුමාව දුටු බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.එතුමා ලොකු පරම්පරාවකින් පැමිණෙන බවත්, එතුමා දේපාලනයටත් වඩා වෙන්නප්පුව නාත්තන්ඩිය සිංහ සමාජයේ සිංහාධිපති වන තත්ත්වයට පැමිණ තිබූ බවත් ලොකු සමාජ සේවයක් සිදු කල බවත්, ජාත්‍යන්තර මට්ටමට ගොස්කීර්තියක් ලබා දුන් නායකයෙකු ලෙස එතුමා අපේ සභාවේ මන්ත්‍රීධූරයක් හොබවීම අපටද ආඩම්බරයක් බවත් පවසමින් එතුමා පිළිබඳ කතාකිරීමට බොහෝ දේද ඇති බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.කිසිවෙකු මෙතුමාට දොස් පවරනවා නම් තමන්ට ඇසී නොමැති බවද පවසමින්, එතුමාගේ ආත්මයට නිත්‍ය සන්තර්පණය ලැබේවායිද ප්‍රාර්ථනා කරමින් තම කතාව අවසන් කරන ලදී.

(v).ගරු මන්ත්‍රී ඩබ්.ශිරොන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව ගරු සභාපතිතුමාගේ ඉල්ලීමක් කිරීමට තිබෙන බවත්, රු.75,000ක් සිමෙන්ති දීමට ගරු සභාපතිතුමා යෝජනා කර තිබූ බවත් එම මුදල පල්ලිය සාදා ගැනීමට ලබා දෙන ලෙසට යෝජනා කරන බවත් ප්‍රකාශ කරන ලදී.

කොට්ඨාසයේ වැඩ කටයුත්තක් බැවින් ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව එය යෝජනාවක් ලෙස ගෙනත් ආධාර මුදල රු.75000ක් පල්ලියේ සංවර්ධනය වෙනුවෙන් වෙන් කරන බවත් අවසර ලැබුණු පසුව නිදහස් කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තමන් ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතාගේ කතාවට එකඟවන බවද, වසර 04ක් විපක්ෂනායක වී සිටියදී තමන් කොලවල ලියාගෙන පැමිණ කතා කිරීමේදී එතුමාද තමාට හැලි ලියාගෙන පැමිණෙන බව පවසා චෝදනා කල බවත් එතුමා 5 වන අවුරුද්දේ හෝ තේරුම් ගැනීම පිළිබඳව සතුටු වන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

එම කතවේ දෙපැත්තක් තිබෙන බවත්, තමන්ගේ පැත්ත කතා නොකල බවත්, තමන් ඒ පිළිබඳව ඊලඟ මහා සභාවේදී කතා කිරීමට සූදානමින් සිටින බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මේ සියල්ල මහන්සි වී සිදු කල බවත් වාහන තබාගෙන නඩු හබ වලට ගොස් වරිපනම් එ්කක පුළුල් කර සිදු කල බවත් සෞඛ්‍ය කම්කරුවන් 110 නිකම් පාර අතුගාන මිනිසුන් නොවන බවත් වැඩ නොකර සිටියා නම් මෙය ණය වූ සභාවක් බවට පත් කර යාමට තිබූ බවත් මේ වන විට ලක්ෂ ගාණක් සභාවට එකතු කර දී තිබෙන බවත්මෙම වැඩ කටයුතු මෙම සේවකයින් නිලධාරීන් නොමැතිව කවුරුන් කලේද යන්නත් විමසා සිටින ලදී.

එහෙම කර නොමැති බවට කිසිවෙකු පැවසූ නොමැති බව ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී.

දෙපැත්තක් තිබෙන බවත්, දකින දේ නොව වැඩක් සිදු කිරීමේදී එය අමාරු බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

(vi).තමන්ට ලිපියක් ලැබී ඇති බවත්, පුත්තලම් දිස්ත්‍රික් ප්‍රවීණයන්ගේ මලල ක්‍රීඩා සංගමයෙන් වෙන්නප්පුව ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණය භාර තරංග කොස්තා මහතා පිළිබඳව එහි සඳහන් වන බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනි කුමාර් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

එය පෞද්ගලික ගැටළුවක් බවත්, එතුමා ලෙටර් හෙඩ් එක භාවිතා කර වරදක් කරන බවත් එය ක්‍රීඩා කමිටුවේ සාකච්ඡා කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙය තමන්ට ලැබුණු ලිපියක් බැවින් ඉදිරිපත් කල බව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය ඔවුන්ගේ පෞද්ගලික ආරවුලක් බවත්,එය ඔවුන් විසඳා ගනීවියැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

(vii).ජයකොඩි ක්‍රීඩාංගනයේ ඉඩම නිදහස් කරගත් සේ තෝප්පුව සහනගම පිට්ටනියද නඩුවක් දමා නිදහස් කර ගන්නා ලෙසත්, ලුණුවිල පුස්තකාල පරිශ්‍රයේ පදිංචි පිරිසද ඉවත් කරන ලෙසත් එලෙසම මැදිකැලේ බදු දුන්නායි කියූ ඉඩම් කොටසේ ඔප්පුව මහා සභාවට ඉදිරිපත් කරන ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

ඉඩම් කැබලි බදු ඔප්පුව දී පිළියෙල කර ඇති බවත්, පල්ලියේ තාප්පයේ ගැන ප්‍රශ්නය තිබෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

(viii).සෙන්දිරියාමුල්ල ඉඩමේ ප්‍රගතිය පිළිබඳව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

සෙන්දිරියාමුල්ලේ ඉඩම සුද්ද පවිත්‍ර කර ඇති බවත්, ලක්ෂ ගණනක් තාප්පයට යන බවත් එබැවින් ඉණිවැටිය සාදා අවසන් කරමුයැයිද වැට සැදීමට පක්ෂ ගණනක් යන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

- ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථීරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව කමිටු වලින් සහ මහා සභාවෙන් ව්‍යාපෘති වැඩ සටහන් කිරීමට යෝජනා කරන බවත් මේ සියල්ල අයවැය ඇතුලේ සිදු කල යුතු බවත් ප්‍රකාශ කරන ලදී.එහි මුදල් කෝටි 39 ක් වෙන් කර තිබෙන බවත් මෙවර අයවැයද විවිධ ඉසව් සඳහා මුදල් වෙන් කර අවසන් බවත් ඒ වෙන් කර තිබෙන මුදල් ගලපමින් මෙහි කලමණාකරණය ලෙස මුදල් යෙදවීමට තමාට සිදු වන බවත් නමුත් මුදල් නොමැතිව යෝජනා පමණක් පැමිණන බවත් එය මුදල් වලින් පෙන්වා මාරු කල යුතු වැය ශිර්ෂය පෙන්වූයේ නම් තමන්ට මෙම කටයුතු කිරීමට හැකි බවත් කමිටු වලින්ද යෝජනා අනුමත කලද තමාගෙන් ඒ සඳහා මුදල් යොදවන ආකාරය නොවිමසූ බවත් ප්‍රකාශ කරන ලදී.මෙම කෝටි 39ට අමතරව කිසිඳු මුදලක් නොලැබෙන බවත්, ඒ මුදල ඇතුළත සිට වියදම් සියල්ල කලමනාකරනය කරන බවත්, මේ වන විට සෙන්දිරියාමුල්ල අළුතින් වහලය ගැසීමට කෝටි 4ක් පමණ යන බවත් එවිට එම මුදල ඒ සඳහා යෙදවීමට තමන් කොහෙන් මුදල් ගන්නේදැයිද ලක්ෂ 18 ගානේ සංවර්ධන කටයුතු සඳහා වෙන් කල මුදල ඒ සඳහා යොදා ගැනීමට තමාට හැකි බවත් එලෙස කාර්යාලයක් කරගෙන යන විට ගැටළු මතු වන බවත් ප්‍රකාශ කරන ලදී.ඩීසල් ලීටරයක් රු.121ක් ගානේ අයවැයට යෙදූ බවත් මේ වන විට කසල ට්‍රැක්ටර් වලට පමණක් ඒ සඳහා ලක්ෂ 80 ක් මේ වසරේදී වෙන් කල ද මේ වන විට එය අවසන් වී ඇති බවත් තමන් මුදල් මාරු කරමින් මෙම මුදල් යෙදවූ බවත් තවත් ලක්ෂ 20ක් පමණ මේ වසරේදී එම ට්‍රැක්ටර් රථවලට පමණක් යාවියැයිද නමුත එම වාහන දුවන්නේ නොමැතිව කටයුතු කල නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී.වරිපනම් එකතු කිරීමට කැබ් රථයෙන්යන බවත් එය නොදී මුදල් එකතු කර ගත නොහැකි බවත් එම මුදල් නොලැබුනොත් තෙල් ගහන් මුදල් දීමට නොහැකි වන බවත් ප්‍රකාශ කරන ලදී.මේ වන විට මන්ත්‍රීවරුන් සඳහා වෙන් කර තිබෙන මුදල් වියදම් කිරීමට නොහැකි බවත් වෙන්

කර තිබුණද එය නාමික බවත් මුදල ඉක්මවා ගොස් ඇති බවත් ප්‍රකාශ කරන ලදී.එම වියදම් මෙවර මුදල් කමිටුවට ලබාදෙන බවත් ඒ සියල්ල තමන් සාදා ඇති බවත් ප්‍රකාශ කරන ලදී. ස්ථිර වැටුප් ප්‍රතිපූර්ණය වන බවත් ඍජු කොන්ත්‍රාත් ඒ නිලධාරීන්ට වැටුප් ගෙවීමට සිදු වන බවත් ලබන වසරේ අයවැයද දින 22කට වඩා වැටුප් සාදන්න එපායැයි උපදෙස් ලැබී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා මේ මේ දේ සිදු වුවාදැයි සොයා බලන බවත් ප්‍රගතිය විමසන බවත් මෙම කොටි 39 ඉතිරි කර තිබුනේ නම් මේ කාර්යාලය තුළ ප්‍රාග්ධන වියදම් වලට හරි පුනරාවර්තන වියදම් වලට හරි හදිසියට ගැනීමට මුදලක් ඉතිරි කර තිබුනේ නම් මේ සියල්ල සිදු කිරීමට තිබූ බවත් නමුත් එලෙස සතයක්වත් ඉතිරි කර නොමැති බවත් සියල්ල වැඩ විෂයන් සඳහා වෙන් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී.අපි කෝටි 4 ½ පෙන් වූ විට එය කොට්ඨාස 25ට ලක්ෂ 18 ගානේ වෙන් කර ඇති බවත්, එබැවින් ඉන් පසුව අයවැයෙහි කොතැනින් වියදම් කරන්නේ දැයිද විමසා සිටින ලදී.මේ වන විට අතිකාල ජූනි මාසයේ සිට කපා හැර ඇති බවත්ගමන් වියදම් නොදෙන බවත් එවා පරිපාලනය කර ගැනීමට හැකි බවත් නිලධාරීන් තමන් මේවා නොදෙන බවට තරහින් සිටියද එක් වැඩක් හෝ අතපසු වී නොමැති බවත් තෙල් වියදම බැලීමේදී දෙසැම්බර් වන විට තෙල් ගැසීමට නොහැකි වන බවත් අයවැය ඉක්මවා වියදම් කිරීමට නොහැකි බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.මෙම සභාවෙන්ම පසුගිය කොරොනා සමයේ ජනතාවට අපහසුබැවින් ලක්ෂ 30ක් පමණ බදු මුදල් කපා හැරි බවත් එවිට අයවැය කෝටි 39 ක් නොව කෝටි 38 පමණ වන බවත් එය අඩු කිරීමේදී එයට සමානව කුමක් අඩුකරන්නේදැයිද එය සංවර්ධන වැඩ වලට වෙන් කර තිබෙන මුදල් අතිරික්තය බවත් එබැවින් පුනරාවර්තන වියදම් වලින් අඩු කිරීමට නොහැකි බවද ප්‍රකාශ කරන ලදී.ඒ සියල්ල සමඟ අප ගමන් කරන බවත් ගරු මන්ත්‍රීතුමා මේවා පිළිබඳව සොයා බලපු එකද හොඳ බවත් හදිසියේවත් හෙට ගංවතුරක් පැමිණියහොත් වැය කිරීමට මුදලක්වත් අප සතුව නොමැති බවත් අතිරේක වැඩ කටයුතු වලට මුදල් නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් පියංකර මහතා මෙය තමන් දැන සිටි බවත්,තමන් මාස 3කට උඩදී ඒ පිළිබඳව පැවසූ බවත් එදින කොම්පෝස්ට් එක සම්බන්ධයෙන් තමන් සතුටු බවත් නමුත් මෙම මුදල අමාත්‍යාංශයෙන් නොලැබෙන බවට තමන්ගේ ඔලුවේ තිබූ බවත් රටගිණිගෙන තිබෙන විට මුදල් නොපැමිණෙන බවට තමන් සිතූ බවත් ප්‍රකාශ කරන ලදී. ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා මෙය මාර සතුටක් බවත් ගරු මන්ත්‍රීසී.පී.සරත් වික්‍රමරත්න මහතා අප සභාව වෙන සභාවල් වාගේ නොව මේක මෙන්න මෙහෙම සභාවක් බවට පැවසූ බවත් එම නිසා මෙය සිදු විය යුතු බවට තම මතකයේ හැටියට පැවසූ බවත් තමන් මේවා පිළිබඳ දැනගෙන කතා කල බවත් ප්‍රකාශ කරන ලදී. කෝටි 2යි ගණනක් වාර්තාවේ සඳහන් වී තිබූ බවත්, කොම්පෝස්ට් අංගණයක් අවශ්‍ය බවත් නමුත් සභාපතිතුමාට යාමට වාහනක් අවශ්‍ය බවත් නමුත් තෙල් නොමැතිව එය නතර කලහොත් කුමක් කරන්නේදැයිද එදින තමන් පැහැදිලි කිරීම කිරීමේදී ප්‍රධාන පරිපාලක නිලධාරියා ලෙස ලේකම් මහතා අවශ්‍ය මඟපෙන්වීම නොදුන් බවත් ප්‍රකාශ කරන ලදී.

එදින තමන් පැහැදිලිවම එය පෙන්වූ බවත්,මෙම මුදල ලැබෙන බවත් ලේකම්මහතා ප්‍රකාශ කරන ලදී.

කෝටි 2 ½ ම ලැබෙන බවත්,අද වන විට කෙතරම් අමාරුකම් තිබුණද ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා මාස 3ක මුදල් එවා ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඝෝෂාව.....

අයවැයේ විෂයන් සඳහා වෙන්කල මුදල් මේ සඳහා නොගෙවූ බවත්, ණයගැතියෝ ණයහිමියෝ කර ගෙවූ බව ලේකම්මහතා ප්‍රකාශ කරන ලදී.

අරගලය අන්තවාදී පිරිස් එකතු වී සිදු කල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ආර්ථික විශ්ලේෂණයක් කර ගැනීමට නොහැකි වීම අප පසින් කර ගත් මෝඩ වැඩක් බවත්, ඩිපෝ එකේ බස් වලට ටයර් අවශ්‍ය වූ විට අළුතින්ම ටයර් දැමීමට සිදු වන බවත් නමුත් පෞද්ගලික බස් වලට රී කන්ඩිෂන් ටයර් දැමීමට හැකි බවත් එලෙසම රජයේ ආයතන වලට යකඩ ගැනීමට අවශ්‍ය වූ විට එම නම් කරන ආයතන වලින්ම ගැනීමට සිදු වන බවත් මෙලෙස හොරකම් කිරීමට ඉඩ දී තිබූයේද පාලකයෝම බවත් ඒවා පිළිබඳව පාර්ලිමේන්තුවේ කතා කිරීමට තිබූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතාගේ කතාව සත්‍ය බවත්, සෙන්දිරියාමුල්ල තවමත් බදු පදනම යටතේ තිබෙන බැවින් වැට ගසා ගනිමුයැයිද ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම අක්කර 4 බේරා ගැනීමට වෙහෙසක් ගත් බවත්,එලෙසම වැට ගසා අවසන් කරමුයැයිද, දෙසැම්බර් මස වන විට කෝටි 2 ½ක මුදලද ලැබෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී වැටට යන වියදම බලමුයැයි ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

වැටට පමණක් ලක්ෂ 35ක් පමණ යන බවත්,මිනින්දෝරු තක්සේරු වටිනාකම තවමත් නොඑවූ බවත් ගරු සභාපතිතුමා පවසා සිටින ලදී.

(ix).ශ්‍රී ලංකා ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මන්ඩලයෙන් ක්‍රියාත්මක කරන ලද ඩිජිටල් පුස්තකාල ව්‍යාපෘතිය යටතේ ස්වයංක්‍රීය කරන ලද කිරිමැටියාන පුස්තකාලය විවෘත කිරීම හා ජාතික කියවීමේ මාසය සමාරම්භක උත්සවය පැවැත්වීමට රු.116,000.00ක මුදලක් වැය දැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 25<br><br>ශ්‍රී ලංකා ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මන්ඩලයෙන් ක්‍රියාත්මක කරන ලද ඩිජිටල් පුස්තකාල ව්‍යාපෘතිය යටතේ ස්වයංක්‍රීය කරන ලද කිරිමැටියාන පුස්තකාලය විවෘත කිරීම හා ජාතික කියවීමේ මාසය සමාරම්භක උත්සවය පැවැත්වීමට රු.116,000.00ක මුදලක් වැය දැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමාගේ සහ ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

(x).වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට අයත් දියුණු කල ගම් ප්‍රදේශ වල වරිපනම් ඒකක නැවත තක්සේරු කිරීමේ වැඩ සටහන යටතේ මේ වන විට තක්සේරු කිරීම ආරම්භ කර ඇති වෙන්නප්පුව වරිපනම් කලාපයේ රාජකාරි කටයුතු සඳහා සහභාගී වී ඇති තක්සේරු නිලදාරීන් සඳහා කාර්යාල පහසුකම් සැපයීම වෙනුවෙන් මාස 03ක කාලයකට වෙන්නප්පුව ,කොළින්ජාඩිය පදිංචි ජේ.කේ.ජේ.ඩී.පෙරේරා මහතාට අයත් නිවසක් මසකට.30,000ක මුදලකට කුලී පදනම මත බදු ලබා ගැනීමට අදාල යෝජනාව ඉදිරිපත් කරන ලදී.

| |
|---|
| තීරණ අංක 26<br><br>වෙන්නප්පුව වරිපනම් කලාපයට අයත් දියුණු කල ගම් ප්‍රදේශයේ වරිපනම් ඒකක තක්සේරුව සඳහා සහභාගී වී සිටින තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා මාස 03ක පමණ කාලයකට කාර්යාල පහසුකම් සැපයීම වෙනුවෙන් වෙන්නප්පුව ,කොළින්ජාඩිය පදිංචි ජේ.කේ.ජේ.ඩී.පෙරේරා මහතාට අයත් නිවසක් මසකට.30,000ක බදු කුලී පදනම යටතේ ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

න්‍යාය පත්‍රය අනුව සියළු වැඩ කටයුතු අවසන් වූ හෙයින් සියලු දෙනාටම ස්තුතිය පළ කරමින් ගරු සභාපතිතුමා විසින් ප.ව 2.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදි.